**අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 ට අනුව අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

**ප්‍රකාශනය**
සැලසුම් අංශය
අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහළ
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

# ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය
# கௌரவ அமைச்சரின் ஆசிச் செய்தி
# Message from the Hon. Minister



## ප්‍රශස්ථ ඵලදායිතාව පදනම් වූ ප්‍රගතිය

## செயலாற்றுகையின் வினைத்திறன்மிக்க மதிப்பீடு

## Progress based on the Sustainable Productivity

ශ්‍රී ලාංකික සංවර්ධනය උදෙසා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වලට අදාළ වාර්ෂික කාර්ය සාධනය 2017 වාර්තාගත කරන අවස්ථාවට සුබ පැතුම් එක්කරන්නේ ඉතාමත් සොම්නසිනි. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු වශයෙන් පුළුල් ක්ෂේත්‍ර තුනක් මෙම වාර්තාව මගින් ආවරණය කරනු ලබයි. අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණුවලට අනුගත වෙමින් ක්‍රියාත්මක කරන ලද මනා පරිපාලන සහ කළමනාකරණ වැඩපිළිවෙළ මෙම වාර්තාවෙන් පැහැදිලිවේ.

ශ්‍රී ලාංකික ජනතාවට 2017 වර්ෂයේ දී නව නිමාවෙන් යුතු විද්‍යුත් ජාතික හැඳුනුම්පත ලබා දීමට හැකිවීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි. මීට අමතරව දෙපාර්තමේන්තුව විසින් ගංවතුර ආපදා සිදුවුනු අවස්ථාවලදී ජංගම සේවා මගින් හැඳුනුම්පත් ලබා දීම එක්දින සේවාව ද කාර්යක්ෂමව ඉටුකිරීමට පියවර ගනු ලැබීය. විදේශීයව වෙසෙන ශ්‍රී ලාංකික ජනතාව ශ්‍රී ලාංකික සංවර්ධන කාර්යයට දායකකර ගැනීම පිණිස ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ආගමන හා විගමන ක්ෂේත්‍රයේ සියලු කාර්යයන් මනාව ඉටුකිරීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට හැකිවිය.

වයඹ සංවර්ධන වැඩපිළිවෙල යටතේ ස්වයං රැකියා උත්පාදනය සඳහා සවිය සහනදායී ණය යෝජනා ක්‍රමය, ඇළ, අමුණු ප්‍රතිසංස්කරණය, මෙන් ම විවිධ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති තුළින් වයඹ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි.

ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අනන්‍යතාව තහවුරුවන අන්දමින් සංස්කෘතික උරුමය සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය උදෙසා දීප ව්‍යාප්ත සංස්කෘතික මධ්‍යස්ථාන පද්ධතිය මඟින් හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් අර්ථවත්ව වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කළ බැව් පැහැදිලි ය. අන්තර් ජාතික සංස්කෘතික සබඳතා පවත්වා ගැනීම, සාර්ක් රටවල අනන්‍යතාවය ඔප්නංවාලීමේ අරමුණෙන් සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම, සංස්කෘතික මධ්‍යස්ථාන අලුතින් ඉදිකිරීම, කලාකරුවන්ට ආධාර ලබා දීම හා සුභසාධනය වැඩිදියුණු කිරීම ආදි සංස්කෘතික ක්ෂේත්‍රයේ අත්පත් කරගත් ප්‍රගතිය අතර ප්‍රමුඛතාවක් ගනී.

ජාතික සංවර්ධන කාර්යයේ දී අප අමාත්‍යාංශය වාර්ෂික ප්‍රගතිය සාධනීය මට්ටමකට ඔසවා තැබීමට ඇප කැප වී ක්‍රියා කළ සියළු දෙනාටම හෘදයාංගම කෘතඥතාව පළකරමි.

இலங்கையின் அபிவிருத்தியை மையமாகக் கொண்டு உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சினால் 2017 ஆம் ஆண்டில் செயற்படுத்தப்பட்ட அபிவிருத்தி நிகழ்ச்சித் திட்டங்களுக்கு உரிய வருடாந்த செயலாற்றுகை 2017 ஆம் ஆண்டிற்கான அறிக்கையினை

வெளியிடுவதனையிட்டு இந்த ஆசிச் செய்தியை மிகுந்த மகிழ்ச்சியுடன் வழங்குகின்றேன். உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் என பரந்த மூன்று விடயங்களை உள்ளடக்கப்பட்டுள்ளது. அமைச்சின் தூரநோக்கு, பணிப் பிரகடனம் மற்றும் நோக்கங்களை மேற்கொள்வதற்கு சிறந்த நிர்வாகம் மற்றும் முகாமைத்து வேலை ஒழுங்கு முறைகள் இவ் அறிக்கையில் தெளிவாகக் காட்டப்பட்டுள்ளது.

இலங்கை மக்களுக்கு 2017 ஆம் ஆண்டில் புதிய முறையில் தயாரிக்கப்பட்ட இலத்திரனியல் அடையாள அட்டைகளை வழங்க முடிந்தமை ஆட்களைப் பதிவு செய்யும் திணைக்களத்திற்குக் கிடைத்துள்ள விசேட வெற்றியாகும். இதற்கு மேலதிகமாக இத் திணைக்களத்தினால் வெள்ள அனர்த்த பாதிப்பு ஏற்பட்ட சந்தர்ப்பங்களில் நடமாடும் சேவை மூலம் உடனடியாக அடையாள அட்டையினை வழங்குதல் மற்றும் ஒரு நாள் சேவையினை மக்கள் சிறந்த முறையில் பெற்றுக் கொள்ளவதற்கு ஏற்பாடு செய்ய முடிந்துள்ளது. வெளிநாடுகளில் இருந்து வரும் இலங்கை மக்கள் இலங்கை அபிவிருத்தி விடயங்களுக்கு உதவிகளை வழங்கும் முகமாக இரட்டைப் பிரஜாவுரிமையை வழங்குதல் மற்றும் குடிவரவு மற்றும் குடியகல்வு விடயத்தில் அனைத்து விடயங்களையும் சிறந்த முறையில் செயற்படுத்துவதற்கு குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களத்திற்கு முடிந்துள்ளது.

வடமேல் மாகாண வேலைத் திட்டத்தின் கீழ் சுய தொழில்களை ஊக்குவிப்பதற்காக இலகு கடன் முறை, நீர்த் தாங்கிகள் மற்றும் அணைக் கட்டுக்களை மீள நிர்மாணித்தல், மக்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்குத் தேவையான அடிப்படை வசதிகளை அபிவிருத்தி செய்யும் திட்டத்தின் கீழ் வயம்ப மக்களின் வாழ்க்கைத் தரத்தினை உயர்த்துவதற்குரிய திறமை எமக்குக் கிடைத்த வெற்றியாகும்.

இலங்கை பிரஜாவுரிமையாளர்களின் அடையாளத்தினை உறுதிப்படுத்தும் முகமாக கலாசார மரபுரிமையைப் பாதுகாத்தல், மேம்பாடு மற்றும் விளம்பரப்படுத்தலின் மூலம் கலாசார அலுவல்கள் திணைக்களம், நாடு பூராகவும் பரந்துள்ள கலாசார மத்திய நிலைய வலையமைப்புடன் ஆக்க பூர்வமான நிகழ்ச்சித் திட்டங்களை அதிகளவில் நடாத்துவது தெளிவாகப் புலப்படுகின்றது. நாடுகளுக்கு இடையில் கலாசார ஒற்றுமையைப் பேணுதல், சார்க் நாடுகளின் அடையாளத்தினை பிரதிபலிக்கும் நோக்குடன் சார்க் கலாசார மத்திய நிலையத்தினை நிர்மாணித்தல், கலாசார மத்திய நிலையங்களை புதிதாக நிர்மாணித்தல், கலைஞர்களுக்கான அன்பளிப்பினை வழங்குதல் மற்றும் நலன்புரி நடவடிக்கைகளை மேலும் அதிகரித்தல் ஆகிய கலாசார பிரிவுகளின் முன்னேற்றம் மிக முக்கியமானதாகும்.

தேசிய அபிவிருத்தி விடயத்தில் எமது அமைச்சு வருடாந்த முன்னேற்றத்தினை சாதனை மட்டத்திற்கு இட்டுச் சென்றுள்ளதுடன் இதற்காக தமது கடின உழைப்பினை அர்ப்பணித்தமை தொடர்பாக எனது இதயபூர்வமான நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

It is with great pleasure that I send these greetings to the “Performance Report 2017” which unfolds the annual achievements of the development programmes implemented in the year 2017 by the Ministry of Internal Affairs, Wayamba Development and Cultural Affairs.The performance report covers three comprehensive fields as Internal Affairs, Wayamba Development and Cultural Affairs. Thereby, it clarifies impressive administration and management procedures which were executed in terms of Vision, Mission and the Objectives of the Ministry effectively.

Introduction of Electronic National Identity Card with modern technological security features for Sri Lankans was a main achievement gained by Department of Registration of Persons in 2017. Additionally, measures have taken to implement one day service on issuance of zzNational Identity Cards through conducting mobile service in the situation of flash floods and landslides by the Department. Further, Department of Immigration and Emigration was able to grant Dual Citizenship which paved the way

to Sri Lankans who hold foreign nationals to contribute in local development process and achieve every role in the field of Immigration and Emigration vested upon to the Department successfully.

It is indeed a great achievement that we were able to uplift the living condition of the people in Wayamba through various development projects of infrastructure facilities as well as"Saviya"loan scheme for generating self-employments and renovation of anicuts and canals under Wayamba Development programme.

It is crystal clear that Department of Cultural Affairs has implemented many significant programmes through Island wide system of Cultural Centres for conservation, promotion and popularization of cultural heritage as to guarantee the identity of the Sri Lankan citizens. Continuation of international cultural relations, construction of SAARC Cultural Centre with the intention of highlighting the Sri Lankan Identity among SAARC Countries, construction of new Cultural Centres, granting financial assistance for artistes and improvement of their welfare are among the progress achieved in the field of cultural affairs.

I would like to express my deep sense of gratitude to all those who dedicated and devoted to uplift the annual progress of our Ministry up to an effective level in the task of National Development.

**එස් බී. නාවින්න**
**கௌரவ. எஸ். பீ. நாவின்ன**
**S.B.Navinne**

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය
**உள்நாட்டு அலுவல்கள், வயம்ப அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்**
Minster of Internal affairs, Wayamba Development and Cultural Affairs

# ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය
# கௌரவ பிரதி அமைச்சரின் ஆசிச் செய்தி
# Hon. Deputy Minister's Message



## මහජන හිතවාදී අමාත්‍යාංශයක වසරක ප්‍රගතිය

## மக்களின் மனம் கவர்ந்த அமைச்சின் வருடத்திற்கான முன்னேற்றம்

## Progress of a People Friendly Ministry

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු යන ක්ෂේත්‍රයන්හි සංවර්ධනය මෙන් ම පොදු ජනතාවගේ යහපත සහතික කරමින් අප අමාත්‍යාංශය ලබාගත් ජයග්‍රහණ වාර්තා කරනු ලබන "කාර්ය සාධන වාර්තාව 2017" වාර්තාවට මෙම පණිවුඩය නිකුත් කරන්නේ මහත් වූ සොම්නසිනි.

සමාලෝචනයට භාජනය වූ කාලය තුළ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ද්විත්ව පුරවැසි සහතිකපත් ප්‍රදානය කිරීම, ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා ආයෝජන, නේවාසික, සංචාරක හා වෙනත් ප්‍රභේද යටතේ වීසා නිකුත් කිරීම ආදී වශයෙන් ආගමන හා විගමන ක්ෂේත්‍රයේ කැපීපෙනෙන ප්‍රගතියක් අත්කර ගැනීමට අපට හැකි විය. හදිසි ආපදා තත්ත්වයන් නිසා අපහසුතාවයට පත්වන ජනතාවට සහනයක් සලසමින් ක්‍රියාත්මක වන ජංගම සේවාවට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු කාර්යයන් විධිමත් හා වේගවත් කිරීමට නූතන තාක්ෂණය යොදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සිය එක්දින සේවාවන් ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවට සිදුවන සේවාව ඉමහත් ය. 2017.10.27 වන දින " සුහුරු" ජාතික හැඳුනුම්පත් කාඩ්පත නිකුත් කිරීම මගින් දියත් කළ වංචාවන්ට එරෙහිව ආරක්ෂණ වැඩපිළිවෙල අප අමාත්‍යාංශයේ පමණක් නොව ජාතියේ ද දැවැන්ත ජයග්‍රහණයකි. උතුරු නැගෙනහිර පළාත්වල සංස්කෘතික මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම, කලාකරුවන්ගේ සුභ සාධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම කෞතුකාගාර ක්ෂේත්‍රයේ නොමැකෙන සටහන් තැබීමට ද අප අමාත්‍යාංශයට හැකිවිය.

මෙම කාර්යයන් සාර්ථක කිරීමට අතිගරු ජනාධිපති තුමාගෙන් හා ගරු අගමැතිතුමාගෙන් ලද මඟ පෙන්වීම කෘතඥ පූර්වකව සටහන් කරමි. තව ද අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ලද සහයෝගය ද සමස්ථ කාර්ය මණ්ඩලයේ කැපවීම, අධිෂ්ඨානය හා එකමුතු බව ද අගය කොට සලකමි.

உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் விடயங்களின் அபிவிருத்தியைப் போன்று பொது மக்களின் நற் சான்றிதழைப் பெறுவதற்காக எமது அமைச்சு பெற்றுக் கொண்ட வெற்றியை அறிக்கையாகச் செய்யப்பட்ட "செயலாற்றுகை அறிக்கை 2017" அறிக்கைக்கு இந்த ஆசிச் செய்தியை மிகுந்த மகிழ்ச்சியுடன் வழங்குகின்றேன்.

முன்னேற்றத்திற்குக் காரணமான கால கட்டத்திற்குள் குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களத்தின் இரட்டைப் பிரஜாவுரிமை சான்றிதழ் வழங்குதல், கடவுச் சீட்டு வழங்குதல் மற்றும் முதலீட்டு, வதிவிட, சுற்றுலா மற்றும் வேறு முறைகளின் கீழ் வீசா வழங்குதல் ஆகியன குடிவரவு மற்றும் குடியகல்வு பிரிவிலே வெளிப்படையாகக் காணக் கூடிய முன்னேற்றமாக எம்மால் காணக்கூடியதாக இருக்கின்றது. திடீர் அனர்த்தங்களினால் பாதிப்புகளுக்கு உட்பட்ட மக்களுக்கு உதவிகளை வழங்கும் திட்டங்களை நடைமுறைப்படுத்தும் செயற் திட்டத்தில் நடமாடும் சேவைக்கு மேலதிகமாக ஆட்களைப் பதிவு செய்யும்

திணைக்களத்தின் பணிகள் முறையாக மற்றும் விரைவாக மேற்கொள்வதற்கு நுட்பமாக தொழில்நுட்ப வசதிகளை இணைத்துக் கொண்டதன் பெறுபேறாக ஒரு நாள் சேவையினை நடைமுறைப்படுத்துவதன் மூலம் மக்களுக்கு வழங்கும் சேவை விரைவாக்கப்பட்டுள்ளது. 2017.10.27 ஆம் திகதி "சுகுரு" தேசிய அடையாள அட்டை வழங்கியதன் ஊடாக ஊழலுக்கு எதிரான பாதுகாப்பான வேலை ஒழுங்குகளை மேற்கொண்டமைக்காக எமது அமைச்சுக்கு மட்டும் அன்றி தேசிய ரீதியாகவும் வெற்றியைப் பெற்றுக் கொண்டுள்ளது. வட கிழக்கு மாகாணங்களில் கலாசார மத்திய நிலையங்களை நிர்மாணித்தல், கலைஞர்களின் நலன்புரிகளைக் கருத்திற் கொண்டு வேலைத் திட்டங்களை நடைமுறைப்படுத்தல் அதே போன்று நூதனசாலைப் பிரிவில் மறக்க முடியாத விடயங்களும் எமது அமைச்சிற்கு உரியதாகும்.

இவ் விடயங்கள் வெற்றிகரமாக அமைவதற்கு கௌரவ ஜனாதிபதி அவர்களின் மற்றும் கௌரவ பிரதமர் அவர்களின் வழிகாட்டல்கள் என்பவற்றிற்கு எனது இதய பூர்வமான நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். மேலும் உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சினால் வழங்கப்பட்ட ஒத்துழைப்பு அனைத்து அலுவலக உத்தியோகத்தர்களின் அர்ப்பணிப்பு, மனஉறுதி மற்றும் ஒன்றிணைந்து செயற்படும் தன்மை என்பவற்றைப் பாராட்டுகின்றேன்.

I am delightful to issue this message to "Performance Report 2017" which discloses the advancements of our Ministry made in the fields of Internal Affairs, Wayamba Development and Cultural Affairs assuring the Public welfare.

During the period under review, we were able to gain an enormous progress of Department of Immigration and Emigration through awarding dual citizenship certificates, issuance of Passports and issuance of visas under investors, residential, tourist and other categories. Excellent services are provided by the Department for Registration of Persons implementing one day service using state-of-the-art technology to speed up and regularize its functions in addition to the mobile service providing a great relief to the victims of catastrophes. "The safety procedure against frauds" launched on 27.10.2017 through the Issuance of Smart Electronic National identity Card is a great victory of our Ministry as well as entire nation. Our Ministry could establish Cultural Centres in North and East Provinces, implement programmes for the welfare of artistes and to mark the history in the field of Museum.

I would like to bestow my sincere gratitude to His Excellency the President and the Hon. Prime Minister for their guidance to make these functions a success. Also, I appreciate the cooperation of the Hon. Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs and the dedication, determination and the unity of the entire Staff.

පාලිත තෙවරප්පෙරුම
கௌரவ. பாலித தெவரப்பெரும
**Palitha Thewarapperuma**

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය
**உள்நாட்டு அலுவல்கள், வயம்ப அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்**
Deputy Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs

# පෙරවදන
# முன்னுரை
# Preface



## ජයග්‍රාහී වසරක ප්‍රගතිය

## வெற்றி ஆண்டின் முன்னேற்றம்

## Progress of a Successful Year

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු යන ක්ෂේත්‍රයන්හි වසරක් පුරා ක්‍රියාත්මක කරන ලද වැඩ පිළිවෙලෙහි කාර්ය සාධනය සටහන් කරනු ලබන මෙම අවස්ථාවට සුභ පැතුම් එක් කරනුයේ ඉමහත් සතුටිනි.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම හැඳුනුම්පත 1971 දී නිකුත් කිරීමෙන් වසර 45කට පසු ශ්‍රී ලාංකික ජනතාවට නව සුහුරු කාඩ්පතක් (Smart Card) භාෂාත්‍රයෙන් ම නිකුත් කිරීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහණයකි. ජනතාවට තම ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටම ප්‍රධාන කාර්යාලයට අයදුම් පත් විද්‍යුත්ව එවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ම (VPN) ජාලයක් මගින් ප්‍රධාන කාර්යාලය ට සම්බන්ධ කිරීමට හැකිවීම හා දෙපාර්තමේන්තු කාර්යයන් විමධ්‍යගත කිරීමේ අරමුණෙන් වයඹ, මධ්‍යම හා දකුණු පළාත්වල පළාත් කාර්යාල පිහිටුවීමට අවශ්‍ය පියවර ගැනීම ද මෙම වසරේ අත්පත් කරගත් ජයග්‍රහණයක් වේ. ආගමන හා විගමන ක්ෂේත්‍රයේ දී දේශීය ජනතාවට මෙන් ම විදේශිකයන් විශාල පිරිසක් සඳහා සුව පහසු හා ගුණාත්මකත්වයෙන් ඉහල සේවාවක් ලබා දීම සඳහා පියවර රැසක් 2017 වර්ෂයේ දී ගනු ලැබූ අතර වීසා ස්ටිකර්, පෝළිම් කළමනාකරණය, විද්‍යුත් දත්ත ගබඩා කිරීම හා මෘදුකාංග සංවර්ධනය විශේෂයෙන් සඳහන් කළ හැකි ය.

වයඹ සංවර්ධනය යටතේ මෙම අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් පානීය ජල ව්‍යාපෘති රැසක් ආරම්භ කිරීමට හැකිවීමත් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීමට හැකිවීමත් තුළින් වයඹ ජනතාවගේ ජල ප්‍රශ්නයට විසඳුම් ලබා දීමට පියවර රැසක් ගැනින.

විදේශ සංස්කෘතික සබඳතා වඩාත් ශක්තිමත් වන අන්දමින් ශ්‍රී ලාංකීය සංස්කෘතිය අන්තර් ජාතිකව ප්‍රචලිත කරමින් ශ්‍රී ලාංකීය සංස්කෘතික කණ්ඩායම් වලට විදේශ රටවල දී සංදර්ශන පැවැත්වීමට හැකිවීම ද එමගින් විවිධ ජයග්‍රහණ ලබා ගැනීමට හැකිවීම ද කැපී පෙනේ. විවිධ විදේශීය සංස්කෘතික කණ්ඩායම් මෙරටට ගෙන්වා සංස්කෘතික සංදර්ශන පැවැත්වීම තුළින් ශ්‍රී ලාංකීය ජනතාවට විදේශීය සංස්කෘතික අංග රසවිඳීමට ද අවස්ථාව සලසා දීමට හැකි විය. එමෙන් ම සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ සභාපතීත්වය දැරීමට හැකිවීම ද සංස්කෘතික ක්ෂේත්‍රයේ අප ලද ජයග්‍රහණයකි.

2017 වසරේ දී ශ්‍රී ලංකාව පුරා විසිරී ඇති සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය ඔස්සේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. සංස්කෘතික මධ්‍යස්ථානවල ඉගෙනුම ලබන දරු දැරියන්ගේ දක්ෂතාවයන් ඔප්නැංවෙන පරිදි ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය පැවැත්වීම මෙන්ම නෙළුම් පොකුණ රඟහල ආශ්‍රිතව විවිධ වැඩසටහන් පැවැත්වීමෙන් ජනතා ප්‍රසාදයට පත්වීමට හැකිවිය.

මෙම කාර්යයන් සාර්ථක කිරීමට අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් හා නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ලද මඟ පෙන්වීම සහ සමස්ථ කාර්ය මණ්ඩලයේ කැපවීම, අධිෂ්ඨානය හා එකමුතු බව ද අගය කොට සලකමි.

உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் எனும் பிரிவுகளில் வருடம் முழுவதும் நடைமுறைப்படுத்தப்பட்ட வேலைத் திட்டங்களின் செயலாற்றுகையினை அறிக்கையிடப்படும் இச் சந்தர்ப்பத்தில் இந்த ஆசிச் செய்தியை மிகுந்த மகிழ்ச்சியுடன் வழங்குகின்றேன்.

ஆட்களைப் பதிவு செய்யும் திணைக்களத்தின் மூலம் முதன் முதலான அடையாள அட்டையானது 1971 ஆம் ஆண்டு வழங்கப்பட்டு 45 வருடங்களின் பின்னர் இலங்கை மக்களுக்கு புதிய சுகுரு காட் (ளுஅயசவ ஊயசன) மூன்று மொழிகளிலும் வழங்க முடிந்துள்ளமை விசேட வெற்றியாகும். மக்களுக்கு தங்களது பிரதேசங்களில் அமைந்துள்ள பிரதேச செயலகத்தின் ஊடாக பிரதான அலுவலகத்திற்கு விண்ணப்பங்கள் இலத்திரனியல் முறை மூலம் அனுப்புவதற்கு 331 பிரதேச செயலகங்களிலும் (ஏீபே) இணையத்தளம் மூலமாக பிரதான அலுவலகத்திற்கு இணைத்துக் கொள்வதற்குரிய திறமை மற்றும் திணைக்கள விடயங்கள் பரவலடையச் செய்யும் நோக்குடன் வடமேல், மத்திய மற்றும் தென் மாகாணங்களில் மாகாண அலுவலகங்களை அமைப்பதற்குத் தேவையான படிமுறைகளை எடுத்துள்ளமையும் இவ் வருடத்தின் வெற்றியாகும். குடிவரவு மற்றும் குடியகல்வுப் பிரிவிலே உள்நாட்டு மக்களுக்கும் அதே போன்று அதிகளவிலான வெளிநாட்டவர்களுக்காக இலகுவான மற்றும் சிறந்த உயர் சேவையினை வழங்குவதற்காக 2017 ஆம் ஆண்டில் படிமுறைகள் எடுக்கப்பட்டுள்ளதுடன் வீசா ஸ்ரிக்கர், வரிசைப்படுத்தும் முகாமைத்துவம், இலத்திரனியல் தகவல்களை களஞ்சியப்படுத்தல் மற்றும் விடய அபிவிருத்தி என்பன விசேடமாக குறிப்பிட முடியும்.

வயம்ப அபிவிருத்தியின் கீழ் இவ் அமைச்சின் பிரதான பங்களிப்பில் தேசிய நீர் வழங்கல் சபையின் ஊடாக குடிநீர்த் திட்டம் ஆரம்பிக்க முடிந்ததுடன் விவசாய சேவைகள் திணைக்களம் மற்றும் வடமேல் மாகாண நீர்ப்பாசனத் திணைக்களத்தின் ஊடாக நீர்த் தாங்கிகள் மற்றும் அணைக் கட்டுக்களை மீள நிர்மாணித்தல் என்பவற்றின் ஊடாக வயம்ப மக்களின் நீர்ப் பிரச்சினைக்கு தீர்வு காணப்பட்டுள்ளது.
வெளிநாட்டு கலாசார உறவுகள் மிகவும் சக்தி வாய்ந்த முறையில் இலங்கை கலாசாரத்தை சர்வதேச ரீதியல் பிரபலப்படுத்தும் முகமாக இலங்கை கலாசார குழுக்களுக்கு வெளிநாடுகளில் காட்சிகளை நடாத்த முடிந்ததுடன் அவ்வாறே பல்வேறு வெற்றிகளையும் பெற்றுக் கொள்ளக் கூடிய திறமைகளையும் வெளிப்படையாகக் காட்டுகின்றது. பல்வேறு வெளிநாட்டுக் குழுக்களை இந் நாட்டிற்கு அழைத்து வந்துகலாசாரக் காட்சிகளை நடாத்துவதன் மூலம் இலங்கை மக்களுக்கு வெளிநாட்டு கலாசார பிரிவுகளை இரசிப்பதற்குரிய சந்தர்ப்பங்களை ஏற்படுத்திக் கொடுக்க முடிந்துள்ளது. அவ்வாறே சார்க் கலாசார மத்திய நிலையத்திலே கட்டுப்பாட்டுச் சபையின் தலைவராகும் தகுதியும் கலாசார பிரிவிலே எமக்குக் கிடைத்த வெற்றியாகும்.

2017 ஆம் ஆண்டிலே இலங்கை முழுவதும் பரவியுள்ள கலாசார மத்திய நிலைய வலையமைப்பினால் பல்வேறு நிகழ்ச்சித் திட்டங்கள் செயற்படுத்தப்படுகின்றன. கலாசார மத்திய நிலையங்களில் கல்வி கற்கும் மாணவ மாணவியர்களின் திறமைகளை மேம்படுத்தும் முகமாக தேசிய இலக்கிய கலை விழாவினை நடாத்துதல் அதே போன்று நெளும் பொக்குண கலை அரங்கிலே பல்வேறு பட்ட நிகழ்ச்சிகளை நடாத்துதல் என்பவற்றின் ஊடாக மக்களின் விருப்பத்தினைப் பெற்றுள்ளது. சார்க் நாடுகளில் அடையாளத்தினை வெளிப்படுத்தும் விதத்தில் சார்க் கலாசார மத்திய நிலையத்தின் நிர்மாணிப்பு வேலைகள் வெற்றிகரமான முறையில் செயற்படுத்தப்படுகின்றது.
இந்த விடயங்கள் வெற்றிகரமாக அமைவதற்கு உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரின் மற்றும் பிரதி அமைச்சரினதும் வழிகாட்டல் மற்றும் அனைத்து அலுவலக உத்தியோகத்தர்களின் அர்ப்பணிப்பு, மனஉறுதி மற்றும் ஒன்றிணைந்து செயற்படும் தன்மை என்பவற்றைப் பாராட்டுகின்றேன்.

It gives me great pleasure to add my best wishes for the event of issuing Performance Report which portrays the implementation of development programmes carried out under the purview of three comprehensive fields namely internal affairs, Wayamba development and cultural affairs throughout the year, 2017.

Launching trilingual Smart Identity Card in 2017 issued by Department of Registration of Persons was a special achievement after 45 years of issuing of the first National Identity Card in 1971. Also, progressive measures such as connecting 331 Divisional Secretariats to Central Office of Registration of Persons via VPN network system, thereby, people can forward their application forms from the Divisional Secretariats of the respective area and taking steps to establish Provincial Offices in North Western, Central and Southern provinces with the objective of decentralize the Departmental duties can be highlighted as notable achievements gained in the year 2017. Further, numerous measures has been executed in order to render highest, reliable and standard service for local community as well as foreigners in the field of Immigration and Emigration in 2017. Commendable services introduced such as visa stickers, queue management system, storage of electronic data and software developments can be especially mentioned at this point.

Wayamba development had accomplished to initiate number of drinking water plant projects via National Water Supply Board with financial contribution granted by the Ministry. Hence, solid measures were taken on solving drinking water scarcity prevailing in North Western Province. A relief to water problem could be provided through rehabilitation of damaged tanks and anicuts with the collaboration of Provincial Department of Irrigation and Department of Agrarian Development.

Sri Lankan cultural groups were able to display our rich cultural heritage by conducting cultural performance shows in overseas and gained numerous triumphs. Thus, it led to strengthen cultural rapport among countries which promotes unique and vibrant Sri Lankan culture internationally. Similarly, opportunities were granted to Sri Lankan spectators on experiencing and appreciating foreign cultural performance by hosting foreign cultural performance shows. Opportunity to hold chairmanship of the Governing Board of SAARC Cultural Centre was also a remarkable achievement that we received during this year.

Cultural Center network which is spread island wide had conducted numerous programmes during 2017. Moreover, National Literary Art Festival with the perspective of fostering creative talents and aesthetic abilities of children who practice at Cultural Centers and various programmes which were performed on cultural diversities staged at Nelum Pokuna Theatre paved the way to acquire admiration and appreciation of the audiences.

Thus, I wish to place on record my sincere appreciation for immense guidance extended to me by the Hon. Minister and Hon. Deputy Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs while recalling the dedication, commitment and intervention of the staff to make performance of the Ministry a success.

ඩී. ස්වර්ණපාල
டீ. சுவர்ணபால
**D. Swarnapala**

ලේකම්
செயலாளர்
Secretary

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
உள்நாட்டு அலுவல்கள், வயம்ப அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Internal Affairs, Wayamba Development and Cultural Affairs

# පටුන


| | පිටු අංක |
|---|---|
| 1. හැඳින්වීම | 01 |
| 1.1 දැක්ම | 01 |
| 1.2 මෙහෙවර | 01 |
| 1.3 අරමුණු | 01 |
| 1.4 ක්‍රියාත්මක ආයතන | 01 |
| 1.5 සංවිධාන ව්‍යුහය | 02 |
| 2. පාලන කටයුතු | 03 |
| 2.1 නිලධාරී තොරතුරු | 03 |
| 2.2 ස්ථාන මාරුවීම් | 07 |
| 2.3 විශ්‍රාම ලබා ගැනීම් | 07 |
| 2.4 පුහුණු | 07 |
| 2.5 අමාත්‍ය මණ්ඩල තීරණ | 08 |
| 2.6 විදේශ සංස්කෘතික සබඳතා | 10 |
| 2.7 සංස්කෘතික මධ්‍යස්ථාන පාලනය | 13 |
| 3. මූල්‍ය කටයුතු | 14 |
| 3.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන | 16 |
| 3.2 සැපයුම් හා ප්‍රසම්පාදන කටයුතු | 21 |
| 4. සංවර්ධන හා සැලසුම් | 22 |
| 4.1 සැලසුම් | 22 |
| 4.2 වයඹ සංවර්ධනය | 22 |
| 4.3 දිස්ත්‍රික් විමධ්‍යගත අයවැය වැඩසටහන | 25 |
| 5. සංස්කෘතික ප්‍රවර්ධනය | 26 |
| 5.1 සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා යටිතල පහසුකම් සංවර්ධනය | 26 |
| 5.2 සංස්කෘතික ප්‍රවර්ධනය | 30 |
| 5.3 ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය - වේයන්ගොඩ | 38 |
| 6. අභ්‍යන්තර කටයුතු | 40 |
| 7. අභ්‍යන්තර විගණන කටයුතු | 41 |

# 1. හැඳින්වීම

## 1.1 දැක්ම

ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ අනන්‍යතාව දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් තහවුරු කරමින්, ජාතියේ ප්‍රෞඪ සංස්කෘතික උරුමය සුරැකීම සහ වයඹ සංවර්ධනයේ නියමුවා වීම.

## 1.2 මෙහෙවර

සිය දේශය තුළ දී ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම ද, ජාතික ආරක්ෂාව හා ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින් රටින් බැහැරවන්නන් හා රටට ඇතුලුවන්නන් නියාමනය කිරීම මගින් ප්‍රත්‍යන්ත පාලනය තහවුරු කිරීම ද, ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම සහ වයඹ පළාත තුළ තිරසාර සමාජ, ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම.

## 1.3 අරමුණු

- දීප ව්‍යාප්තව ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය ක්‍රියාත්මක කිරීම තුළින් දේශීය සංස්කෘතියේ ජාතික අනන්‍යතාව සහ විවිධත්වය සහතික කිරීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම.
- අන්තර්ජාතික පිරිවිතරයන් හා ප්‍රමිතීන්ට අනුකූලව, ශ්‍රී ලාංකේය අනන්‍යතාවය හා ජාතික ආරක්ෂාව තහවුරු කරමින්, සංචරන පාලන කටයුතු මෙහෙයවීම.
- ශ්‍රී ලාංකික පුරවැසියන් ලියාපදිංචි කරමින් ජාතික පුද්ගල නාම ලේඛණයක් ස්ථාපිත කර, පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම උදෙසා හිමිකම් ලබන තැනැත්තන්හට හඳුනාගැනීමේ පත්‍ර නිකුත් කිරීම.
- සංස්කෘතික හා ස්වභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම තුළින් මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය, රසාස්වාදය උදෙසා අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම.
- ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය, කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ව්‍යාප්තිය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- වයඹ පළාත තුළ කඩිනම් සමාජ, ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට සහ එම පළාතේ ජනතාවට සුවිශේෂී වූ ගැටළු විසඳීමට දායක වීම.

## 1.4 ක්‍රියාත්මක ආයතන

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- වයඹ ලේකම් කාර්යාලය

## 1.5. සංවිධාන ව්‍යුහය


ලේකම්
අතිරේක ලේකම් (පාලන,මුදල්,විදේශ)
අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන)
අතිරේක ලේකම් (සංවර්ධන)
අතිරේක ලේකම් (අභ්‍යන්තර කටයුතු)
අතිරේක ලේකම් (වයඹ සංවර්ධන)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන,මුදල්,විදේශ)
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී (ප්‍රසම්පාදන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන)
අධ්‍යක්ෂ (සැලසුම්)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (වයඹ සංවර්ධන)
අභ්‍යන්තර විගණක
සහකාර ලේකම් (පාලන)
සහකාර ලේකම් (විදේශ)
ගණකාධිකාරී (ගෙවීම් i)
ගණකාධිකාරී (ගෙවීම් ii)
සහකාර ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන ii)
සහකාර ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන ii)
ඉංජිනේරු
සහකාර අධ්‍යක්ෂ (සැලසුම් i)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම් ii)
සහකාර ලේකම් (අභ්‍යන්තර කටයුතු)
නීති නිලධාරී
සහකාර ලේකම් (වයඹ සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ (වයඹ සංවර්ධන)
ඉංජිනේරු
සම්බන්ධීකරණ ලේකම්
භාෂා පරිවර්තක
පරිපාලන නිලධාරී
කාර්මික නිලධාරී
සැලසුම් ශිල්පී
භාෂා පරිවර්තක
පරිපාලන නිලධාරී
කාර්මික නිලධාරී
ශාඛා ප්‍රධානී (අභ්‍යන්තර විගණන)
ශාඛා ප්‍රධානී (පාලන)
ශාඛා ප්‍රධානී (ප්‍රවාහන)
ශාඛා ප්‍රධානී (මාධ්‍ය)
ශාඛා ප්‍රධානී (විදේශ)
ශාඛා ප්‍රධානී (මුදල්)
ශාඛා ප්‍රධානී (ප්‍රසම්පාදන)
ශාඛා ප්‍රධානී (සංස්කෘතික ප්‍රවර්ධන)
ශාඛා ප්‍රධානී (සංවර්ධන)
ශාඛා ප්‍රධානී (සැලසුම්)
ශාඛා ප්‍රධානී (අභ්‍යන්තර කටයුතු)
ශාඛා ප්‍රධානී (වයඹ සංවර්ධන)
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර
විගණන සහකාර
ඩිජිටල් කැමරා ක්‍රියාකරු
වීඩියෝ කැමරා ශිල්පී
ගිණුම් සහකාර
ආදායම සහකාර
ගබඩා භාරකරු
සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී
සංවර්ධන සහකාර
කාර්යාල කාර්ය සහයක
රියදුරු
කැමරා ක්‍රියාකාර සහයක
ගබඩා සහකාර

# 02. පාලන කටයුතු

## 2.1 නිලධාරී තොරතුරු

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සියළු පරිපාලනමය කටයුතු ක්‍රියාත්මක කිරීම හා එහි අධීක්ෂණ ක්‍රියාවලිය පාලන කටයුතු යටතේ සිදු කෙරේ.

### ප්‍රධාන නිලධාරී මණ්ඩලය

**අමාත්‍යාංශය**

| අනු අංකය | තනතුර | නම | කාල සීමාව |
|---|---|---|---|
| 1. | අමාත්‍යාංශ ලේකම් | ඩී. ස්වර්ණපාල මහතා | 2015.09.09 සිට |
| 2. | අතිරේක ලේකම් (පාලන, මුදල්) | එස්.එම්.ජී.එන්. ධර්මසේකර මහතා | 2013.12.03 සිට |
| 3. | අතිරේක ලේකම් (සංවර්ධන) | බර්නාඩ් වසන්ත මහතා | 2013.03.05 සිට |
| 4. | අතිරේක ලේකම් (ප්‍රවර්ධන) | ඒ. සේනානයක මහතා | 2017.08.02 සිට |
| | | ප්‍රදීපා සේරසිංහ මිය | 2015.02.05 සිට 2017.06.01 දක්වා |
| 5. | අතිරේක ලේකම් (අභ්‍යන්තර කටයුතු) | යූ.කේ. බණ්ඩාර මහතා | 2013.07.01 සිට |
| 6. | අතිරේක ලේකම් (විදේශ) | එල්.එච්. රම්‍යසිරි මහතා | 2017.10.23 සිට |
| 7. | ප්‍රධාන ගණකාධිකාරී | එම්.ටී.එස්.එස්. පියසේන මහත්මිය | 2011.06.01 සිට |
| 8. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | කේ.කේ.ජී. සිසිර කුමාර මහතා | 2012.01.09 සිට |
| 9. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන, මුදල්, විදේශ) | තරණි අනොජා ගමගේ මහත්මිය | 2014.08.07 සිට |
| 10. | අධ්‍යක්ෂ (සැලසුම්) | එම්.එම්.ජී.කේ. මීගහකොටුව මහත්මිය | 2015.12.21 සිට |
| 11. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) | හේමන්ත වන්නිආරච්චි මහතා | 2016.01.08 සිට |
| 12. | ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) | ඒ.පී. කොඩිකාර මහත්මිය | 2016.01.25 සිට |
| 13. | ඉංජිනේරු | ඒ. ජී. මුනාස් මහතා | 2013.10.28 සිට |
| 14. | ගණකාධිකාරී (ගෙවීම් - i) | එස්. කොතලාවල මහත්මිය | 2016.06.01 සිට |
| 15. | ගණකාධිකාරී (ගෙවීම් - ii) | ජනිත ඩී. හතරසිංහ මහතා | 2012.06.05 සිට |
| 16. | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) i | එම්.ජී.ජී. නිරෝෂිණී මහත්මිය | 2017.10.02 සිට |
| | | ආර්. එස්. හර්ෂ`ණී පීරිස් මහත්මිය | 2015.01.19 සිට 2017.06.01 දක්වා |
| 17. | සහකාර අධ්‍යක්ෂ ii (සැලසුම්) | ඒ. ඩී. චාන්දනී මෙනවිය | 2016.07.18 සිට |
| 18. | සහකාර ලේකම් (ප්‍රවර්ධන) i | දිලුම් දයාරත්න මහතා | 2012.09.24 සිට |
| 19. | සහකාර ලේකම් ii (ප්‍රවර්ධන) | බුද්ධිකා දිසානායක මහත්මිය | 2015.05.18 සිට |
| 20. | සහකාර ලේකම් (අභ්‍යන්තර කටයුතු) | එච්. ඒ. වී. කේ. පලංසූරිය මහත්මිය | 2014.04.01 සිට |
| 21. | නීති නිලධාරී | ඩී. එස්. ජයවීර මහත්මිය | 2013.11.11 සිට |
| 22. | ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | ටී. එම්. එම්. පී. වියෝනි ප්‍රනාන්දු මහත්මිය | 2015.09.14 සිට |
| 23''. | පරිපාලන නිලධාරී | හේමමාලි ගුණවර්ධන මහත්මිය | 2016.09.13 සිට 2017.11.01 දක්වා |

| අනු අංකය | තනතුර | නම | කාල සීමාව |
|---|---|---|---|
| 24. | භාෂා පරිවර්තක | එච්. ඒ. ආර්. සී. හේවාආරච්චි මහත්මිය | 2006.04.06 සිට |
| | | කුමාරි රත්නායක මහත්මිය | 2013.01.02 සිට |
| | | ජී.එම්.ඩී.එන්.ජීවන්දරගේ මහත්මිය | 2017.01.03 සිට |

### වයඹ ලේකම් කාර්යාලය

| අනු අංකය | තනතුර | නම | කාල සීමාව |
|---|---|---|---|
| 1. | අතිරේක ලේකම් | හේරත් යාපා මහතා | 2016.04.22 සිට 2017.04.28 දක්වා |
| | | එස්.එම්.ජී.එන්. ධර්මසේකර මහතා | 2017.05.02 සිට 2017.07.06 දක්වා |
| | | එල්.එච්. රම්‍යසිරි මහතා | 2017.07.07 සිට 2017.10.20 දක්වා |
| | අතිරේක ලේකම් (වැ.බ.) | බර්නාඩ් වසන්ත මහතා | 2017.10.23 සිට 2017.12.31 දක්වා |
| 2. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ඒ.එම්.ආර්. සුදර්ශනී මහත්මිය | 2016.09.02 සිට |
| 3. | සහකාර ලේකම් | එච්.ඩී.එන්.ඩී. දසනායක මහත්මිය | 2017.01.01 සිට |
| 4. | සහකාර අධ්‍යක්ෂ | ජේ. ඒ. එස්. ජයසිංහ මහතා | 2017.01.01 සිට |
| 5. | ඉංජිනේරු | ජේ. ඒ. ඒ. එල්. ජයසිංහ මහතා | 2016.05.05 සිට |
| 6. | පරිපාලන නිලධාරි | ඩබ්ලිව්. එම්. ඒ. වාසල මහතා | 2016.06.07 සිට |
| 7. | ගණකාධිකාරී | ඒ.ඩී.ජී.ඩී.ගුණතිලක මෙනවිය | 2016.08.22 සිට |

## සේවක සංඛ්‍යාව - අමාත්‍යාංශය

### ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරී මණ්ඩලය

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ලේකම් | ශ්‍රී.ල.ප.සේ. විශේෂ | 01 | 01 | - |
| අතිරේක ලේකම් | ශ්‍රී.ල.ප.සේ. විශේෂ | 04 | 04 | - |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ල.ප.සේ. I | 02 | 02 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ල.ග.සේ. I | 01 | 01 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ල.ග.සේ. I | 01 | 01 | - |
| අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) | ශ්‍රී.ල.ක්‍ර.සේ. I | 01 | 01 | - |
| ගණකාධිකාරී | ශ්‍රී.ල.ග.සේ. I | 01 | 02 | - |
| ගණකාධිකාරී | ශ්‍රී.ල.ග.සේ. III/II | 02 | 01 | - |
| අභ්‍යන්තර විගණක | ශ්‍රී.ල.ග.සේ. III/II | 01 | 01 | - |
| සහකාර ලේකම් | ශ්‍රී.ල.ප.සේ. III/II | 05 | 03 | 02 |
| සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) | ශ්‍රී.ල.ක්‍ර.සේ. III/II | 02 | 02 | - |
| නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත III/I | 01 | 01 | - |
| ඉංජිනේරු | ශ්‍රී.ල.ඉ.සේ III/II | 01 | 01 | - |
| | **එකතුව** | **23** | **21** | **02** |

### තෘතියික මට්ටමේ නිලධාරී මණ්ඩලය

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| පරිපාලන නිලධාරී | රා.කළ.සහ.සේ. - අධි ශ්‍රේණිය | 01 | 01 | 01 |
| ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය II/ I | 03 | 03 | - |
| | එකතුව | 05 | 05 | 01 |

### ද්විතියික මට්ටමේ නිලධාරී මණ්ඩලය

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී | ආශ්‍රිත සේවා III/II/I | 362 | 326 | 36 |
| සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය III/II/I | | | |
| කාර්මික නිලධාරී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III/II/I | 01 | - | 01 |
| සැලසුම් ශිල්පී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III/II/I | 01 | - | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. III/II/I | 70 | 50 | 20 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය III | 01 | 01 | - |
| වීඩියෝ කැමරා ක්‍රියාකරවන්නා | ස්ථිර | 01 | 01 | - |
| නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | 01 | - | 01 |
| සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී | දෙපාර්තමේන්තුගත III/II/I | 201 | 146 | 55 |
| | එකතුව | 638 | 524 | 114 |

### ප්‍රාථමික මට්ටමේ නිලධාරී මණ්ඩලය

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 31 | 30 | 01 |
| කාර්යාල කාර්ය සහයක | කාර්යාල කාර්ය සහයක සේවය | 33 | 31 | 02 |
| පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| සංස්කෘතික මධ්‍යස්ථාන කාර්යාල කාර්ය සහයක | | 201 | 166* | 35 (අනියම්) |
| සංස්කෘතික මධ්‍යස්ථාන මුරකරු | | 315 | 278 | 36 |
| වීඩියෝකරණ සහකාර | | 01 | 01 | - |

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ආදේශක මුරකරු | | | 78 | |
| | එකතුව | 582 | 585 | 74 |

* මධ්‍යස්ථාන කාර්යාල කාර්ය සහයක අනියම් 35 ක් ද ඇත.

## සේවක සංඛ්‍යාව - වයඹ ලේකම් කාර්යාලය

### ජ්‍යේෂ්ඨ මට්ටමේ නිලධාරී මණ්ඩලය

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| අතිරේක ලේකම් | ශ්‍රී.ල.ප.සේ. විශේෂ | 01 | 01 | - |
| ජ්‍යෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ල.ප.සේ. I | 01 | 01 | - |
| සහකාර ලේකම් | ශ්‍රී.ල.ප.සේ. III | 01 | 01 | - |
| ගණකාධිකාරී | ශ්‍රී.ල.ග.සේ. III/II | 01 | 01 | - |
| ඉංජිනේරු | ශ්‍රී.ල.ඉ.සේ III | 01 | 01 | - |
| සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ල.ක්‍ර.සේ. III | 01 | 01 | - |
| | එකතුව | 06 | 06 | - |

### තෘතියික මට්ටමේ නිලධාරී මණ්ඩලය

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| පරිපාලන නිලධාරී | රා.කළ.සහ.සේ. - අධි ශ්‍රේණිය | 01 | 01 | - |
| | එකතුව | 01 | 01 | - |

### ද්විතියික මට්ටමේ නිලධාරී මණ්ඩලය

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය III/II/I | 10 | 12 | 02 (අතිරික්ත) |
| තාක්ෂණික නිලධාරී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III/II/I | 01 | - | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. III/II/I | 06 | 03 | 03 |
| | එකතුව | 17 | 15 | 06 |

### ප්‍රාථමික මට්ටමේ නිලධාරී මණ්ඩලය

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 02 | 02 | - |
| කාර්යාල කාර්ය සහයක | කාර්යාල කාර්ය සහයක සේවය | 05 | 05 (අනියම්) | |
| | එකතුව | 07 | 07 | - |

## 2.2 ස්ථාන මාරුවීම්

| අනු අංකය | නම | ස්ථාන මාරුවී ගිය දිනය | තනතුර |
|---|---|---|---|
| 01. | පී.ජී.ඩී. සේරසිංහ මිය | 2017.06.01 | අතිරේක ලේකම් (ප්‍රවර්ධන) |
| 02. | ආර්.එස්. හර්ෂනී පීරිස් මිය | 2017.06.01 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) |
| 03. | වයි. හේමමාලි ගුණවර්ධන මිය | 2017.11.01 | පරිපාලන නිලධාරිනි |
| 04. | ටී.ටී.ඩී.බණ්ඩාර මයා | 2017.01.06 | රාජ්‍ය කළමනාකාරණ සහකාර |
| 05. | ඩී.එස්.ජේ. පෙරේරා මයා | 2017.07.03 | රාජ්‍ය කළමනාකාරණ සහකාර |
| 06. | එච්.එම්.පී. හෙට්ටිපොල මිය | 2017.04.24 | රාජ්‍ය කළමනාකාරණ සහකාර |
| 07. | යූ.ඩී. පරණගම මිය | 2017.02.17 | රාජ්‍ය කළමනාකාරණ සහකාර |
| 08. | ඒ.ජී.පී.එස්. බණ්ඩාර මිය | 2017.07.07 | රාජ්‍ය කළමනාකාරණ සහකාර |
| 09. | වාසනා දිනුක්ෂි ද සොයිසා මෙනවිය | 2017.06.01 | රාජ්‍ය කළමනාකාරණ සහකාර |
| 10. | ජේ.එච්.එම්.අයි.එම්. ඒකනායක මිය | 2017.03.17 | රාජ්‍ය කළමනාකාරණ සහකාර |
| 11. | බී.එම්.එන්.කේ. පෙරේරා මයා | 2017.03.17 | සංවර්ධන නිලධාරි |
| 12. | වී.එච්. ජයලත් විදානගේ මයා | 2017.04.25 | කා.කා.ස. |
| 13. | එස්.එම්.එස්. බණ්ඩාර මයා | 2017.06.16 | රියදුරු |
| 14. | ඒ.එස්.බී. බක්මීවැව මයා | 2017.04.25 | කා.කා.ස. |

## 2.3 විශ්‍රාම ලබාගැනීම්

| අනු අංකය | නම | විශ්‍රාම ලබා ගත් දිනය | තනතුර |
|---|---|---|---|
| 01 | හේරත් යාපා මයා | 2017.04.24 | අතිරේක ලේකම් (වයඹ සංවර්ධන) |
| 02 | එස්.එම්. මහවත්ත මිය | 2017.08.01 | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 03 | ඒ.එච්.පී. මාලනී මිය | 2017.11.25 | රාජ්‍ය කළමනාකාරණ සහකාර |
| 04 | ආර්.පී.ආර්. මානෙල් මිය | 2017.04.16 | කා.කා.ස. |
| 05 | ඒ.එම්.ඩී.එල්.ආර්. විජේතුංග මයා | 2017.12.10 | රියදුරු |

## 2.4 පුහුණු

අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ හැකියාවන් හා කුසලතා පුළුල් කිරීමේ අරමුණින් පහත දැක්වෙන පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට හැකිවිය. පුහුණු වැඩසටහන්වල සම්පත් දායකත්වය සඳහා ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීනත්වයක් දක්වන අමාත්‍යාංශයේ හා බාහිර සම්පත්දායකයින් යොදා ගනු ලබයි.

| | පුහුණු වැඩසටහන | සහභාගී වූ නිලධාරීන් ගණන |
|---|---|---|
| 01. | කාර්යාල සේවක සේවය සඳහා පුහුණු වැඩමුළුව | 50 |
| 02. | මධ්‍යස්ථාන ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී සඳහා වූ ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ වැඩමුළුව | 90 |

**විදේශ පුහුණු**

අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ හැකියාවන් හා කුසලතා පුළුල් කිරීමේ අරමුණින් විදේශ රටවල පැවති පුහුණු වැඩමුළු සඳහා අමාත්‍යාංශ නිලධාරීන් සහභාගී කරවීමට හැකි විය.

| | පුහුණු වැඩසටහන | සහභාගී වූ නිලධාරීන් ගණන |
|---|---|---|
| 01. | Conservation & Exploitation of World Cultural Heritage for Developing Countries | 08 |
| 02. | Capacity Building Training Programme | 01 |

මෙම පුහුණු වැඩසටහන් සඳහා රු.2,322,458.80 ක මුදලක් වැය වී ඇත.

## 2.5 අමාත්‍ය මණ්ඩල තීරණ

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු යන ක්ෂේත්‍රවල ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කාර්යයන් පිළිබඳව හා පරිපාලනමය අවශ්‍යතා පිළිබඳව සහ ජාතික වශයෙන් වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා පහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර ඇත.

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

| අංකය | ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ |
|---|---|
| CM/02/2017 | රාජ්‍යතාන්ත්‍රික හා රාජකාරි / සේවා ගුවන් ගමන් බලපත්‍ර හිමි පුද්ගලයන් වීසා අවසරපත් ලබාගැනීමෙන් නිදහස් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මියන්මාර රජය අතර ඇති කර ගනු ලබන ගිවිසුම |
| 15 | කුරුණෑගල | පොල්ගහවෙල | 2,531,231.75 |
| 16 | කුරුණෑගල | මාවතගම | 5,551,141.57 |
| 17 | කුරුණෑගල | බමුණාකොටුව | 6,911,275.96 |
| 18 | කුරුණෑගල | පොල්පිතිගම | 19,962,999.70 |
| | එකතුව | | 121,819,195.34 |
| **2. සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණ කටයුතු** | | | |
| දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන 110ක අලුත්වැඩියා කිරීම්, වැඩිදියුණු කිරීම්, යටිතල පහසුම් හා සනීපාරක්ෂක කටයුතු | | | 116,315,508.66 |
| 2017 වර්ෂයේදී විවෘත කරන ලද සංස්කෘතික මධ්‍යස්ථානය<br>2017 වර්ෂයේදී විවෘත කරන ලද සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා උත්සව වියදම් | | | 8,946,528.25<br>1,200,000.00 |
| 2017 වර්ෂයේදී විවෘත කරන ලද සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා භාණ්ඩ ලබා ගැනීම | | | 10,000,000.00 |
| මෙහෙයුම් මැදිරිය ඉදි කිරීම | | | 2,000,000.00 |
| කුඩා ශ්‍රවණාගාරය ඉදි කිරීම | | | 3,000,000.00 |
| **එකතුව** | | | **468,115,712.00** |

- නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම, දැනට පවතින මධ්‍යස්ථානවල වැඩිදියුණු කිරීම්, ප්‍රතිසංස්කරණ යටිතල පහසුකම් හා සනීපාරක්ෂක කටයුතු ආදී ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශය විසින් රු. මිලි. 468.11 ක් වෙන් කරන ලද අතර අක්මුදල් නොලැබීම හේතුවෙන් එහි සත්‍ය වියදම රු. මිලි. 371.95 කි.

## සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම, වේයන්ගොඩ

දීප ව්‍යාප්තව පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය, සම්පත්දායකයින්, අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය හා ජාතික හා අන්තර්ජාතික ප්‍රසංග සඳහා ඉදිරිපත් කරන සංස්කෘතික මධ්‍යස්ථාන සිසු සිසුවියන් පුහුණු කිරීම සඳහා ඉදිකරන ලද පුහුණු මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කටයුතු සිදු කිරීම.

### 2017 වසරේ ඉදිකිරීම් ප්‍රගතිය

| සිදුකරන ලද කාර්යය | ඇස්තමේන්තු මුදල රු. | වැය වූ මුදල රු. | වැඩ අවසන් කල යුතු දිනය | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| පිරිමි නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම | 8,353,774.11 | 7,264,032.68 | 2017.12.31 | 100% | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. |
| රථ වාහන අංගනය ඉදිකිරීම | 1,536,305.00 | 1,536,305.00 | 2017.10.31 | 100% | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. |
| කැට අල්ලා පිවිසුම් මාර්ගය සකස් කිරීම (නව නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු වලින් ඉතිරි මුදලින්) | 1,089,741.43 | 1,089,741.43 | 2017.12.31 | 100% | පිවිසුම් මාර්ගය සකස් කර අවසන් කර ඇත. |
| නව නේවාසිකාගාර ගොඩනැගිල්ලට තිර රෙදි දැමීම | 308,750.00 | 308,750.00 | 2017.12.31 | 100% | තිර රෙදි දැමීම අවසන් කර ඇත. |

2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය - රු. 10,000,000.00
2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) - රු. 9,911,283.13 (99%)
2017.12.31 දිනට භෞතික ප්‍රගතිය - 100%

### ආදිවාසී ගම්මාන සංරක්ෂණය

ශ්‍රී ලංකාවේ මුල්ම ගෝත්‍රික ජනතාව වැදි ජනතාවයි. වැව් හා වනාන්තර ආශ්‍රිත ජනාවාස සකසා ගත් මොවුන් යක්ෂ ගෝත්‍රිකයන් ය. දැනට ලංකාවේ මොවුන්ට අයත් ජනාවාස 06 ක් පමණ ඇති අතර, ආදිවාසී නායක ඌරුවරිගයේ වන්නියලැත්තන් ජීවත්වන දඹාන කොටබකින ප්‍රදේශයේ ඉදිකර ඇති ආදිවාසී කෞතුකාගාරය ඔවුන්ගේ ජනජීවිතයේ ප්‍රෞඪ අතීත පැතිකඩ කියාපායි. සොබා දහම සමග අතිශය බැඳීමක් ඇති මොවුන් සතු දේශීය වෙදකම පිළිබඳ දැනුම, සිරිත් විරිත්, ආදි මෙවලම් භාවිතය පිළිබඳ දැනුම, කිරිකොරහා නැටීම, හැක්මේ වැනි ශාන්තිකර්ම සංරක්ෂණය ආදිය වෙනුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ හෙනානිගල හා මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරේ යන වැදි ගම්මානවල ජන උරුම මධ්‍යස්ථාන ඉදිකිරීම කිරීම ආරම්භ කරන ලද්දේ 2015 වර්ෂයේ ය.

| දිස්ත්‍රික්කය | මධ්‍යස්ථානය | ලබා දුන් මුදල රු. | 2017.12.31 දිනට වියදම රු. |
|---|---|---|---|
| අම්පාර | හෙනානිගල | 4,400,000.00 | 4,002,699.00 |
| මඩකලපුව | වාකරේ | 4,400,000.00 | 3,732,173.70 |

මෙම මධ්‍යස්ථාන ඉදිකිරීම වෙනුවෙන් රු.මි. 8.8 ක් 2017 වර්ෂයට වෙන්වූ අතර, රු.මි. 8.08 ක වියදමින් මධ්‍යස්ථාන ඉදිකර ඇත.

### සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම

කලාපීය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම හා නඟා සිටුවීමත්, විවිධ සම්ප්‍රදායන් හා සංස්කෘතික විවිධත්වයන් අතර සම්බන්ධතාවයන් ගොඩනැගීමත් සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ මූලික අරමුණ වේ. මෙම මධ්‍යස්ථානය සාර්ක් කලාපීය රටවල කලාකරුවන්ගේ ප්‍රධානතම රැස්වීම් මූලස්ථානය ලෙසත්, කලාපීය සාම්ප්‍රදායික කලාකරුවන් දිරිමත් කිරීමට හා ඔවුන්ට අනුග්‍රාහකත්වය දැක්වීමට වැඩසටහන් හඳුන්වාදෙන සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙසත් ක්‍රියාත්මක වනු ඇත. 2011 ජූලි 21 සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

මොරටුව විශ්ව විද්‍යාලය ඉදිකිරීම්, සැලසුම් හා වාස්තු විද්‍යානුකූල මග පෙන්වීම හා උපදේශකත්වය මත ශ්‍රී ලංකා යුධ හමුදා 4 වන ඉංජිනේරු බලකාය විසින් ඉදිකිරීම් කටයුතු කරනු ලැබේ. ඉහත ආයතන දෙක සම්බන්ධීකරණයෙන් හා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි ලබාදීමෙන් අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවීම සිදුකරයි.

### ව්‍යාපෘතියේ ප්‍රධාන අංග

- ප්‍රධාන ගොඩනැගිල්ල (වර්ග අඩි 100,543.38)
- පුහුණු මධ්‍යස්ථානය (වර්ග අඩි 37,213.75)
- සාර්ක් රටවල සහ අනෙකුත් අමුත්තන් සඳහා වන නේවාසික පහසුකම් (වර්ග අඩි 41,524.90)
- ඉදිරි රථගාල හා පිවිසුම (වර්ග අඩි 63,604)

| | | |
|---|---|---|
| මුළු ඇස්තමේන්තුගත වියදම | - | රු.1,585,600,000.00 |
| 2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය | - | රු.196,284,288.00 |
| 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) | - | රු.127,235,865.27(65%) |
| 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය | - | 70% |

1. ප්‍රධාන ගොඩනැගිල්ල ටයිල් කිරීම, ඇලුමිනියම් දොර ජනෙල් සවි කිරීම හා විදුලි තතැඳුම් කිරීම.
2. පුහුණු මධ්‍යස්ථානය ටයිල් කර ඇත. ඇලුමිනියම් දොර ජනෙල් සවි කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.
3. සාර්ක් රටවල සහ අනෙකුත් අමුත්තන් සඳහා වන නේවාසිකාගාර කොන්ක්‍රීට් වහල ඉදිකර ඇත.
4. රථ ගාල කොන්ක්‍රීට් කටයුතු අවසන් කර ඇති අතර අවසන් නිමැවුම් කටයුතු කිරීම.

## 5.2 සංස්කෘතික ප්‍රවර්ධනය

### සංස්කෘතික මධ්‍යස්ථාන පාඨමාලා

2017.12.31 දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටුවා ඇති
සංස්කෘතික මධ්‍යස්ථාන ගණන - 190

- විශ්වවිද්‍යාල වල පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන ගණන - 07
  - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
  - කොළඹ විශ්වවිද්‍යාලය
  - කැළණිය විශ්වවිද්‍යාලය
  - ශ්‍රී පාලි මණ්ඩපය
  - රුහුණු විශ්වවිද්‍යාලය
  - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
  - රජරට විශ්වවිද්‍යාලය

- සංස්කෘතික මධ්‍යස්ථානවල පවත්වනු ලබන පාඨමාලා
  - උඩරට, පහතරට, සබරගමු සහ ජන නැටුම්
  - පෙරදිග සහ අපරදිග සංගීතය
  - නාට්‍ය හා රංග කලාව
  - චිත්‍ර, මූර්ති සහ කැටයම් කලාව
  - කායික හා මානසික වර්ධනය
  - අත්කම් නිපැයුම්
  - සිංහල, දෙමළ, ඉංග්‍රීසි, පාලි හා සංස්කෘත භාෂාවන්

- 2017 වර්ෂයේ සංස්කෘතික මධ්‍යස්ථාන වලින් පුහුණුව ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව - 43791
- සම්පත් දායකයන් ගණන - 1682

**සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් (ජාතික හා ප්‍රාදේශීය)**

අරමුණ - ප්‍රදේශයේ සියලුම වයස් කණ්ඩායම්වල සහභාගීත්වයෙන් සහ ප්‍රදේශයේ අනුග්‍රාහකයන්ගේ හා රාජ්‍ය ආයතනවල දායකත්වයෙන් සාරධර්ම පිරි සමාජයක් බිහිකිරීම

**අමාත්‍යාංශය දායකත්වය දැක්වූ ජාතික වැඩසටහන් සහ පවත්වන ලද විශේෂ වැඩසටහන්**

| දිනය | වැඩසටහන හා පැවැත්වූ ස්ථානය | අමාත්‍යාංශයේ දායකත්වය/සහභාගීත්වය |
|---|---|---|
| 2017.01.05 | හොරණ කදගන ජල පවිත්‍රාගාරය විවෘත කිරීම | වෙස් නර්තන ශිල්පීන් කණ්ඩායමක් ලබාදීම (කඩුවෙල සංස්කෘතික මධ්‍යස්ථානය |
| 2017.01.13 | මතුගම ආනන්ද ශාස්ත්‍රාලීය කලා උළෙල | නර්තන කණ්ඩායම් දෙකක් ලබාදීම (ශ්‍රී පාලි මණ්ඩප සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.01.21 | උඩුගම ශ්‍රී මහාබෝධි විහාරයේ පෙරහැර | නර්තන කණ්ඩායම් තුනක් ලබා දීම (යක්කලමුල්ල සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.02.04 | ජාතික නිදහස් දින උළෙල ආගමික වතාවක් කිරීම | වෙස් නර්තන ශිල්පීන් කණ්ඩායමක් ලබාදීම (කඩුවෙල සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.03.04 | ගැටහැත්ත විහාරස්ථානයේ පෙරහැර | නර්තන කණ්ඩායම් දෙකක් ලබා දීම (ඇහැළියගොඩ සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.04.22 | සිංහල අලුත් අවුරුදු උත්සවය - බුලත්සිංහල | නර්තන ප්‍රසංගයක් ඉදිරිපත් කිරීම (ඉංගිරිය, පොකුණුවිට, මිල්ලනිය, ශ්‍රී පාලි මණ්ඩප සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.05.11 | ගම්පහ ශ්‍රී වෛශාඛ්‍ය තෙමඟුල් පෙරහැර | වෙස් නර්තන කණ්ඩායම් දෙකක් ලබාදීම (ඇඹරළුව සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.05.11/12/13 | සිරි දළදාවත රූපවාහිනි ප්‍රසංගය - ජාතික රූපවාහිනිය සමග | ප්‍රසංගය සඳහා සහභාගී වීම (මහරගම, කැස්බෑව, අත්තනගල්ල, ඇඹරළුව හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.05.12 | ජාත්‍යන්තර වෙසක් උත්සවය - බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව | බෙර කණ්ඩායම් හා හේවිසි කණ්ඩායම් සැපයීම. (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල සංස්කෘතික මධ්‍යස්ථානය, කැස්බෑව, මහරගම, අත්තනගල්ල, කඩුවෙල සංස්කෘතික මධ්‍යස්ථාන |
| 2017.05.13 | ජාත්‍යන්තර වෙසක් උත්සවය - නෙළුම් පොකුණ රංග ශාලාව | මුද්‍රා නාට්‍ය සඳහා ශිල්පීය දායකත්වය |

| දිනය | වැඩසටහන හා පැවැත්වූ ස්ථානය | අමාත්‍යාංශයේ දායකත්වය/සහභාගීත්වය |
|---|---|---|
| 2017.06.08 | මිහින්තලා රජමහා විහාර හේවිසි පූජාව | හේවිසි නර්තන ශිල්පීන් ලබාදීම (කහටගස්දිගිලිය හා රජරට විශ්වවිද්‍යාල සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.06.08 | තිස්සමහාරාම පෙරහැර | නර්තන කණ්ඩායම් ලබාදීම (තිස්සමහාරාම සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.06.18 | වේයන්ගොඩ දඩගමුව විහාරස්ථානයේ පෙරහැර | නර්තන කණ්ඩායම් හතරක් ලබාදීම (ඇඹරළුව හා අත්තනගල්ල සංස්කෘතික මධ්‍යස්ථානය |
| 2017.07.04 | වීදියගොඩ රජමහා විහාරයේ පෙරහැර | නර්තන කණ්ඩායම් හතරක් ලබාදීම (පොකුණුවිට සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.07.08 | දෙනිපිටිය වැලිහිඳ පෙරහැර | නර්තන කණ්ඩායම් හතරක් ලබාදීම (වැලිගම හා දෙනිපිටිය සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.07.28 | රස්නායකපුර නිලමෙහෙවර ජංගම සේවය | නර්තන කණ්ඩායම් ලබාදීම (වාරියපොල සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.08.20 | රාජගිරිය සුරම්‍යාරාම පෙරහැර | නර්තන කණ්ඩායම් ලබාදීම (මහරගම හා කැලණිය සංස්කෘතික මධ්‍යස්ථානය) |
| 2017.10.05 | යාපහුව රාජමහා විහාර පෙරහැර | නර්තන කණ්ඩායම් ලබාදීම (ගල්ගමුව, වාරියපොල, අඹන්පොල, මහව සංස්කෘතික මධ්‍යස්ථාන) |
| 2017.10.06 | මකුළුදුව පුරාණ විහාර පෙරහැර | නර්තන කණ්ඩායම් ලබාදීම (මහරගම සංස්කෘතික මධ්‍යස්ථාන) |
| 2017.10.15 | කොල්ලුපිටිය වාළුකාරාම පෙරහැර | බෙර ශිල්පීන් ලබාදීම (මහරගම සංස්කෘතික මධ්‍යස්ථාන) |
| 2017.12.01 | වරකාපොල නැව්ගල සුදර්ශනාරාම විහාර පෙරහැර | හේවිසි කණ්ඩායම් ලබාදීම (වරකාපොළ සංස්කෘතික මධ්‍යස්ථාන) |

### සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල සේවාව

සංස්කෘතික මධ්‍යස්ථාන ආශ්‍රිත ග්‍රාමීය ජනතාවගේ හා සංස්කෘතික මධ්‍යස්ථානවල පාඨමාලා හැදෑරීමට පැමිණෙන සිසුන්ගේ කියවීමේ පුරුද්ද සහ සාහිත්‍ය රසවින්දන හැකියාව, දැනුම, අවබෝධය වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන පුස්තකාල සේවය ක්‍රියාත්මක කරනු ලබයි.

- 2017.12.31 දිනට පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල
  i. සංස්කෘතික මධ්‍යස්ථානවල පිහිටුවා ඇති පුස්තකාල ගණන - 190
  ii. ජංගම පුස්තකාල ගණන - 08

- ඒවායේ පොත් සංඛ්‍යාව හා 2017.12.31 දිනට ඊට වැයවූ වියදම - 2017 වර්ෂයේ දී මිලදී ගත් පොත් සංඛ්‍යාව 32,034 කි. ඒ සඳහා වන වියදම රු. 8,087,000.00 කි.

- පුස්තකාල පොත් තෝරා ගත් ක්‍රමවේදය - රාජ්‍ය සාහිත්‍ය සම්මාන, ස්වර්ණ පුස්තක සම්මාන සහ ගොඩගේ සම්මාන තරගවලදී අවසන් වටයෙන් තේරුණු ග්‍රන්ථ මිලදී ගැනීම.

### පුස්තකාල පාඨක සංඛ්‍යාව

සංස්කෘතික මධ්‍යස්ථාන තුල පිහිටා ඇති පුස්තකාල වල පාඨක සංඛ්‍යාව

| පළාත | සංස්කෘතික මධ්‍යස්ථාන ගණන | පාඨක සංඛ්‍යාව |
|---|---|---|
| වයඹ පළාත | 25 | 9822 |
| දකුණ පළාත | 37 | 10588 |

| පළාත | සංස්කෘතික මධ්‍යස්ථාන ගණන | පාඨක සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර පළාත | 23 | 6820 |
| උතුරු මැද පළාත | 18 | 4525 |
| සබරගමුව පළාත | 16 | 7220 |
| ඌව පළාත | 18 | 4453 |
| නැගෙනහිර පළාත | 15 | 2850 |
| උතුරු පළාත | 09 | 1825 |
| මධ්‍යම පළාත | 29 | 6728 |
| එකතුව | 190 | 54831 |

**ක්‍රියාත්මක වන ජංගම පුස්තකාල පාඨක සංඛ්‍යාව**

ප්‍රවාහන අපහසුතා පවතින ප්‍රදේශවල පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන විසින් ත්‍රී රෝද රථ හා පාපැදි මගින් ජංගම පුස්තකාල සේවයක් ක්‍රියාත්මක කරනු ලබයි.

| පළාත | සංස්කෘතික මධ්‍යස්ථානය | පාඨක සංඛ්‍යාව |
|---|---|---|
| දකුණු පළාත | අකුරැස්ස | 88 |
| | කටුවන | 36 |
| | වීරකැටිය | 58 |
| බස්නාහිර පළාත | පානදුර - වෑකඩ | 42 |
| | පිංවත්ත | 54 |
| | කොරස | 152 |
| උතුරු මැද පළාත | නොච්චියාගම ප්‍රා.ලේ. කාර්යාලය | 68 |
| | මහලිදවත්ත | 56 |
| එකතුව | | 554 |

**ජාතික සාහිත්‍ය කලා උත්සවය**

**අරමුණ**

සාහිත්‍ය නිර්මාණවේදීන් හා කලාකරුවන් ඇගයීම හා ස්පර්ෂ හා අස්පර්ෂ උරුමයන් ප්‍රකට කිරීම.

**සෙසු අරමුණු**

පොදු ජනතාව අතර සාහිත්‍ය සහ කලාව පිළිබඳව රුචිකත්වය වැඩිදියුණු කිරීම, ළමා පරපුරට සාහිත්‍ය හා කලාව වඩාත් සමීප කරවීම, ඔවුන්ගේ කුසලතා වර්ධනයට ඉඩකඩ සැලසීම.

**ක්‍රියාත්මක ක්‍රමවේදය**

සාහිත්‍ය, සංගීත, නැටුම්, සංස්කෘතිකාංග, චිත්‍ර, අත්කම් ආදී සියළු අංගයන් ඇතුළත් වන පරිදි, කලාකරුවන්ගේ හා සාහිත්‍යධරයින්ගේ ප්‍රධානත්වයෙන්, දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන සිසු සිසුවියන්ගේ සහභාගීත්වයෙන්, සම්මාන ප්‍රදානෝත්සව, දේශන, ප්‍රදර්ශන, වැඩමුළු, නාට්‍ය, ප්‍රසංග වැනි වැඩසටහන් වාර්ෂිකව පවත්වනු ලැබේ.

| | | |
|---|---|---|
| 2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය | - | රු.8,000,000.00 |
| මු.රෙ. 66,69 මාරු කිරීම | - | රු335,300.00 |
| අතිරේක ප්‍රතිපාදන ලැබීම් | - | රු.4,800,000.00 |
| 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) | - | රු.13,134,877.44 |
| 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය | - | 100% |

**මේ යටතේ පැවැත්වූ ප්‍රධාන අංග**

- දේශනේත්‍ර සම්මාන ප්‍රදානෝත්සවය
- දිවයිනේ පළාත් 09 නියෝජනය වූ ආකාරයේ අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශන කුටි
- පොත් ප්‍රදර්ශන  කුටි
- නර්තන ප්‍රසංග
- නාට්‍ය ප්‍රසංග
- චිත්‍රපට උළෙල
- චිත්‍ර තරග
- ඡායාරූප තරග
- තාල හා නාද වැඩසටහන් වැඩමුළුව
- කෙටි චිත්‍රපට තරග (ජංගම දුරකතන වීඩියෝ මාධ්‍ය)
- ගී රස වින්දන වැඩසටහන්
- සාහිත්‍ය රසවින්දන වැඩසටහන්
- ප්‍රවීණ කලාකරුවන් ඇගයීම

**විශේෂ සිදුවීම් සහ සමාජ සංස්කෘතික කටයුතු**

දිවයින පුරා විසිර ඇති සංස්කෘතික මධ්‍යස්ථානයන් විසින් දේශීය සංස්කෘතික අංගයන් ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම.

2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය - රු. 10,000,000.00
2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) - රු.9,681,034.00 (97%)

| අනු අංකය | වැඩසටහනේ නම | පැවැත්වූ ස්ථානය | වැය කළ මුදල රු. | 2016.12.31 දිනට භෞතික ප්‍රගතිය % | මූල්‍ය ප්‍රගතිය (වියදම) % |
|---|---|---|---|---|---|
| 1. | සෙනෙහස ජාතික වැඩසටහන | නුවරඑළිය සංස්කෘතික මධ්‍යස්ථානය | රු. 311,232.00 | 100% | 100% |
| 2. | උරුම මග වැඩසටහන | උතුරු මැද හා දකුණු පළාතේ සංස්කෘතික මධ්‍යස්ථාන | රු.750,000.00 | 100% | 100% |
| 3. | "ඉටු මිතුරු" නාට්‍ය වැඩසටහන | කැළණිය සංස්කෘතික මධ්‍යස්ථානය | රු.950,000.00 | 100% | 100% |
| 4. | "කිවිවර වරුණ" වැඩසටහන | හංවැල්ල (සීතාවක) සංස්කෘතික මධ්‍යස්ථානය | රු. 55,000.00 | 100% | 100% |
| 5. | "නාද" සංගීත ප්‍රවර්ධන වැඩසටහන | බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී | රු. 830,400.00 | 100% | 100% |
| 6. | "Sharing & Caring" සංස්කෘතික වැඩසටහන | යාපනය වීරසිංහම් ශාලාව | රු. 750,000.00 | 100% | 100% |
| 7. | "අපේ ගමයි අපේ කමයි" සංස්කෘතික වැඩසටහන | හාලි ඇල සංස්කෘතික මධ්‍යස්ථානය | රු. 802,462.50 | 100% | 100% |
| 8. | සංස්කෘතික මධ්‍යස්ථානයන්හි විවිධ සංස්කෘතික වැඩසටහන් | සංස්කෘතික මධ්‍යස්ථානයන්හි | රු. 5,231,939.50 | 80% | 76% |
| | **එකතුව** | | **රු. 9,681,034.00** | | |

### රාජ්‍ය සේවා සංස්කෘතික කටයුතු නංවාලීම

රාජ්‍ය හා රාජ්‍යානුබද්ධ ආයතනවල සේවක ප්‍රජාවේ නිර්මාණ කුසලතා ඇගයීම හා එළිදැක්වීම තුළින් එම නිලධාරීන් තවදුරටත් සාහිත්‍ය කටයුතුවල නිරත කිරීමට අපේක්ෂා කෙරේ.

- 2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය - රු. 2,500,000.00
- 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) - රු. 2,462,051.00 (100%)
- 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය - 100%

### අන්තර් රාජ්‍ය සේවක සාහිත්‍ය නිර්මාණ තරඟාවලිය

අන්තර් රාජ්‍ය සේවක සාහිත්‍ය නිර්මාණ තරගාවලිය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් කෙටිකතා, ගීත රචනා, චිත්‍ර, පද්‍ය රචනා, ළමා නිර්මාණ යන අංශ යටතේ පැවැත්වූ අතර, සිංහල මාධ්‍යයෙන් ලැබූ මුළු නිර්මාණ සංඛ්‍යාව 595කි. දෙමළ මාධ්‍යයෙන් ලැබූ මුළු නිර්මාණ ගණන 266 කි. චිත්‍ර සඳහා සම්මාන ප්‍රදානය නොවූ අතර අනෙකුත් අංශ සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය නියෝජනය වන පරිදි සම්මාන 32 ක් ද ප්‍රදානය කෙරිණි.

### අන්තර් රාජ්‍ය සේවක කෙටි නාට්‍ය තරඟාවලිය

මේ යටතේ සිංහල මාධ්‍යයෙන් නිර්මාණ 25ක් ඉදිරිපත් වූ අතර සම්මාන 10ක් පිරිනැමීය. දෙමළ මාධ්‍යයෙන් නිර්මාණ 18 ක් ලැබුණු අතර සම්මාන 06 ක් ප්‍රදානය කරන ලදී.

### සංස්කෘතික මධ්‍යස්ථාන පුහුණු වැඩසටහන්

සංස්කෘතික මධ්‍යස්ථානවල පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා දායකත්වය ලබාදෙන සම්පත්දායකයන් (ගුරුවරුන්) වෙත ගෙවීම් කටයුතු සිදු කිරීම. 2017.12.31 වන විට සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා සම්පත්දායකයින් 1682ක් දායකත්වය ලබා දේ.

| | | |
|---|---|---|
| 2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය | - | රු. 94,297,000.00 |
| මු.රෙ. 66, 69 මාරු කිරීම් | - | රු. 1,443,600.00 |
| 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) | - | රු. 81,376,790.59 (90%) |
| 2017.12.31 දිනට ක්‍රියාත්මක සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා දායකත්වය ලබාදෙන සම්පත්දායකයන් (ගුරුවරුන්) ගණන | - | 1,682 |

### සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා සංගීත උපකරණ හා ගෘහ භාණ්ඩ සැපයීම

සංස්කෘතික මධ්‍යස්ථාන වල පවත්වන විවිධ පාඨමාලා සඳහා සංගීත / නර්තන උපකරණ හා පරිපාලන කටයුතු ඉහළ නැංවීමට අවශ්‍ය ගෘහ භාණ්ඩ හා පුස්තකාල ප්‍රවර්ධනය සඳහා පොත් මිලදී ගැනීම.

| | | |
|---|---|---|
| 2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය | - | රු. 20,000,000.00 |
| මු.රෙ. 66,69 මාරු කිරීම | - | රු. 2,845,000.00 |
| අතිරේක ප්‍රතිපාදන ලැබීම් | - | රු. 20,000,000.00 |
| 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) | - | රු. 40,835,063.31 |
| 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය | - | 100% |

සංස්කෘතික මධ්‍යස්ථාන 157ක් අතරේ මෘදංගම්, ශ්‍රැති පෙට්ටි, බෙර, ගිටාර්, හොරණෑ ආදී සංගීත හා නර්තන උපකරණ 663 ක් ලබා දී ඇත. එමෙන්ම සංස්කෘතික මධ්‍යස්ථාන 67ක් අතරේ කාර්යාලයීය උපකරණ හා වෙනත් අවශ්‍ය උපකරණ 1,388 ක් ලබා දී ඇත. මීට අමතරව සංස්කෘතික මධ්‍යස්ථාන 190 ක් සඳහා රු. 8,087,000.00 ක් වටිනා පොත් ලබා දෙන ලදී.

**සාම්ප්‍රදායික දැනුම හා සංස්කෘතික වටිනාකම් පිළිබඳ පර්යේෂණ කටයුතු**

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක කරන සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය ඔස්සේ පර්යේෂණ කාර්යයන් අභිප්‍රේරණය කිරීම.

**ක්‍රියාත්මක ක්‍රමවේදය** - විශ්වවිද්‍යාලයන් තුළ ක්‍රියාත්මක කරනු ලබන සංස්කෘතික මධ්‍යස්ථානයන් 07 හි විද්‍යාර්ථයින් පර්යේෂණ 09 ක් සිදු කරනු ලබයි.

| | | |
|---|---|---|
| 2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය | - | රු.5,000,000.00 |
| මු.රෙ. 66,69 මාරු කිරීම | - | රු.3,500,000.00 (ශිල්ප ගම්මාන වැඩසටහනට රු. 1,500,000 ක් හා ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සඳහා රු. 2,000,000 ක් මාරු කර ඇත. |
| 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) | - | රු.1,465,809.49 |
| 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය | - | 100% |

| සංස්කෘතික මධ්‍යස්ථානයේ නම | පර්යේෂණ මාතෘකාව |
|---|---|
| සංස්කෘතික මධ්‍යස්ථානය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | හින්දු කෝවිල්හි දේව වන්දනාවන් පිළිබඳ අධ්‍යයනයක් (උතුර සහ බස්නාහිර පළාත් දෙකෙහි ) |
| සංස්කෘතික මධ්‍යස්ථානය - කොළඹ විශ්වවිද්‍යාලය | දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ දේශිය වෙදකමට යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් යොදා ගත් අයුරු පිළිබඳ අධ්‍යයනයක් |
| සංස්කෘතික මධ්‍යස්ථානය - රාගම වෛද්‍ය පීඨය කැළණිය විශ්වවිද්‍යාලය | සංගීත ශ්‍රවණය සිංහල ගැබිණි කාන්තාවන්ගේ ආතතිය කෙරෙහි බලපාන අයුරු පිළිබඳ නියමු අධ්‍යයනය |
| සංස්කෘතික මධ්‍යස්ථානය - ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | වකුගඩු උවදුර රජරටින් තුරන් කිරීමට සමාජ සංස්කෘතික මානව විද්‍යාත්මක අධ්‍යයනයක් |
| සංස්කෘතික මධ්‍යස්ථානය - රුහුණු විශ්වවිද්‍යාලය | මුද්‍රණ තාක්ෂණයේ ව්‍යාප්තිය හේතු කොට ගෙන ප්‍රචලිත වූ මාතර කවියේ අපරාර්ධයේ කාව්‍යය ප්‍රවණතා පිළිබඳ විමර්ශනයක් (1900 - 1930 කාල පරිච්ජේදය) |
| සංස්කෘතික මධ්‍යස්ථානය - රුහුණු විශ්වවිද්‍යාලය | කඩවර වන රක්ෂිතයට අයත් නියඳගල පුරාවිද්‍යාත්මක පරිශ්‍ර ප්‍රදේශය හා ඒ අවට ප්‍රදේශයේ අප්‍රකට සංස්කෘතික පරිශ්‍ර පිළිබඳව ගවේෂණාත්මක අධ්‍යයනයක් |
| සංස්කෘතික මධ්‍යස්ථානය - කැළණිය විශ්වවිද්‍යාලය | සියනෑ කෝරළයේ ප්‍රාදේශිය දේව ඇදහිලි හා බැඳි ජන ජීවිතය |
| සංස්කෘතික මධ්‍යස්ථානය - කැළණිය විශ්වවිද්‍යාලය | Performing Identity( Interpretation and Performance of Student Identity within University Culture |
| සංස්කෘතික මධ්‍යස්ථානය - ශ්‍රී පාලි මණ්ඩපය | ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය කෙරෙහි ජනමාධ්‍යයේ බලපෑම - රූපවාහිනී මාධ්‍යය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් |

**ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන්**

1. කුවන්නා නෘත්‍යය කාව්‍යය නිර්මාණාවලිය එළි දැක්වීම
2. සංස්කෘතික කඳවුර පැවැත්වීම

| | | |
|---|---|---|
| 2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය | - | රු. 20,000,000.00 |
| 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) | - | රු. 15,191,709.45 |
| 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය | - | 95% |

| වැඩසටහනේ නම | පැවැත්වූ ස්ථානය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| කුවන්නා නෘත්‍ය කාව්‍ය නිර්මාණාවලිය එළි දැක්වීම | නෙළුම් පොකුණ රඟහලේදී | 90% |
| සංස්කෘතික කඳවුර පැවැත්වීම | මින්නේරිය කාලතුවක්කු බලකා පුහුණු පාසල | 100% |

## සංස්කෘතික කඳවුර පැවැත්වීම

**අරමුණ**

සංස්කෘතික හුවමාරු වැඩසටහන් මගින් ජාතික සමගිය සමානාත්මතාව සහ සහයෝගිතාව ඇති කරමින් සමාජයේ අභියෝග ජයගත හැකි තරුණ ග්‍රාමීය නායකයින් බිහි කිරීම.

**ක්‍රියාත්මක ක්‍රමවේදය**

දිස්ත්‍රික් තුනක සිංහල, දමිළ, මුස්ලිම් ජාතීන් නියෝජනය කරමින් වයස 18-22 අතර, සංස්කෘතික මධ්‍යස්ථානයන්හි සේවය ලබන තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවා වැඩමුළු, සම්මන්ත්‍රණ, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, රසවින්දන වැඩ සටහන් ආශ්‍රය කරමින් සහභාගිත්ව කඳවුරු සම්ප්‍රදායට වැඩ සටහන ක්‍රියාත්මක වේ.

**ප්‍රගතිය**

මෙම සංස්කෘතික හුවමාරු වැඩසටහන 2017 මැයි 6, 7, 8, 9 යන දිනයන්හි මින්නේරිය කාලතුවක්කු බලකා පුහුණු පාසලේදී මධ්‍යම, සබරගමුව, උතුරු පළාත හා මඩකලපුව හා පුත්තලම දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් සංස්කෘතික මධ්‍යස්ථාන ශිෂ්‍ය, ශිෂ්‍යාවන් 150 ක් සඳහා පවත්වන ලදී.

## කුවන්නා නෘත්‍ය කාව්‍ය නිර්මාණාවලිය

**ප්‍රධාන අරමුණ**

සාම්ප්‍රදායික හා නව නිර්මාණාත්මක සංගීත හා නර්තන කලා අංග සංරක්ෂණය ප්‍රවර්ධනය හා ව්‍යාප්තිය සිදුකරමින්, නර්තන හා සංගීත කලා ශිල්පීන් ජාතික වශයෙන් මතු කර ගැනීමේ උසස් කලා රසාස්වාදයක් සමාජගත කිරීම තුළින් සංස්කෘතික ප්‍රවර්ධනයට මංපෙත් සැකසීම.

**ක්‍රියාත්මක ක්‍රමවේදය**

ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම මේ වනවිට සක්‍රීයව ක්‍රියාත්මකවන සංස්කෘතික මධ්‍යස්ථාන 190 සහභාගී කරගනිමින් ප්‍රාථමික, කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ වශයෙන් දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ප්‍රතිභා ප්‍රසාද නමින් තරඟ පවත්වා එම තරඟ වලින් කුසලතාවන් දක්වන දරු දැරියන් තෝරා ඔවුන් යොදා ගනිමින් ජාතික මට්ටමේ ප්‍රසංගයක් පැවැත්වීම.

**සුවිශේෂී අරමුණු**

- සංස්කෘතික මධ්‍යස්ථාන ඔස්සේ ක්‍රියාත්මක කරන වැඩසටහන් වලට වැඩි වටිනාකමක් දීම
- සංස්කෘතික මධ්‍යස්ථානවල සේවා ලබන දූ දරුවන් සඳහා හොඳ සමාජගත පිළිගැනීමක් ඇතිකිරීම
- තමා අයත් ජන සමාජයේ සංස්කෘතිකමය වටිනාකම් පිළිබඳ අවබෝධය සහිත කුසලතා පූර්ණ දක්ෂ දරුවන් රටට හඳුන්වා දීම
- සාම්ප්‍රදායික නර්තනාංග සංරක්ෂණය කරමින් දිරි ගැන්වීම
- ලංකාව පුරා විසිරී පවතින විවිධ සම්ප්‍රදායන්ට අයත් ජන කොටස් හා සංස්කෘතීන්ගේ විවධත්වය හඳුනාගැනීම
- සංස්කෘතික මධ්‍යස්ථානවල සිසුන්ගේ සමූහිකත්වය, සහභාගීත්වය වර්ධන කිරීම තුළින් පෞරුෂ වර්ධනයට හා කුසලතා සංවර්ධනයට ඉඩකඩ සැලසීම
- විවිධ සම්ප්‍රදායන් සමඟ බද්ධව ඇති අනන්‍ය ලක්ෂණ හා විවිධත්වය අවබෝධ කරගත් ශ්‍රී ලාංකේය ප්‍රජාවකට ඒකීය සංස්කෘතිකයකට අනුගත වීමට ඇති හැකියාව තහවුරු කිරීම

**ප්‍රගතිය**
විජය කුවේණි පුරාවෘත්තය ආශ්‍රය කර ගනිමින් කුවන්නා නෘත්‍ය කාව්‍ය නිර්මාණාවලිය දිවයින පුරා විසිරී ඇති සංස්කෘතික මධ්‍යස්ථානයන්හි අංකුර කලා ශිල්පීන් 190ක ශිල්පීය දායකත්වයෙන් පැවැත්වීම සඳහා අවශ්‍ය සියළු සංවිධාන කටයුතු සිදුකරන ලදී.

**ශිල්ප ගම්මාන වැඩසටහන**
ශ්‍රී ලාංකික සංස්කෘතියට අනන්‍ය වූ සාම්ප්‍රදායික කර්මාන්ත හඳුනාගැනීම හා ඒවායේ තිරසාර පැවැත්මට කටයුතු කිරීම.

| | | |
|---|---|---|
| 2017 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය | - | රු. 5,000,000.00 |
| මු.රෙ.66,69 මාරු කිරීම් | - | රු. 1,500,000.00 |
| 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (වියදම) | - | රු. 5,544,105.00 |

ශිල්ප ගම්මාන වැඩසටහන යටතේ වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව තල් නිපැයුම් ගම්මානයේ හා කෑගල්ල දිස්ත්‍රික්කයේ දූදිගම බෙර නිෂ්පාදන ගම්මානයේ නිපැයුම්කරුවන්ගේ නිෂ්පාදන ආලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථාන ඉදිකිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරන ලද අතර එහි මූල්‍ය ප්‍රගතිය රු. 5,544,105.00 ක් විය.

## 5.3 ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය,වේයන්ගොඩ

සාරධර්ම පිරි සමාජයක් බිහි කිරීමේ මූලික අපේක්ෂාවෙන් අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන විවිධ වැඩසටහන් සඳහා ජාතික පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යවතාවයක් මතුවිය. ඒ අනුව වේයන්ගොඩ ජාතික පුහුණු මධ්‍යස්ථානය ඉදිකර 2008 දෙසැම්බර් 26 වන දින විවෘත කරන ලදී.

ඒ අනුව අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනවල නේවාසික හා නේවාසික නොවන පුහුණු වැඩසටහන් සඳහා මෙය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිතයට ගන්නා ලදී. විශේෂයෙන්ම දීපව්‍යාප්තව පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය, සම්පත්දායකයින්, අමාත්‍යාංශ කාර්යමණ්ඩලය හා ජාතික හා අන්තර්ජාතික ප්‍රසංග සඳහා ඉදිරිපත් කරන සංස්කෘතික මධ්‍යස්ථාන සිසු සිසුවියන් පුහුණු කිරීමේ වැඩසටහන් පුහුණු මධ්‍යසස්ථානය තුළ පවත්වන ලදී.

මීට අමතරව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල නේවාසික හා නේවාසික නොවන පුහුණු වැඩසටහන් ද මෙම ආයතනය තුළ පවත්වනු ලබයි.

**දැක්ම**
පුහුණුව තුළින් සෞන්දර්යාත්මක සංවේදීතාවයෙන් පරිපූර්ණ ශ්‍රී ලාංකීය සමාජයක් බිහි කිරීම.

**මෙහෙවර**
පුහුණුව ඔස්සේ අවදි කරන ශිල්පීය විභවතාවයන් උද්දීපනය කරමින් මානව සම්පතෙහි සෞන්දර්යාත්මක නිපුණතාවන් හි ඵලදායිතාවය ඉහළ නැංවීම මඟින් සමාජයීය සංවර්ධනයෙන් පරිපූර්ණ සමාජයක් ගොඩනැගීම පිණිස සංස්කෘතික විෂය භාර අමාත්‍යාංශය ඉටු කරන ජාතික මෙහෙවරට සහය වීම.

කාර්ය මණ්ඩලය 2017.12.31 දිනට

- මාණ්ඩලික නොවන - 04
- කණිෂ්ඨ - 02
- කණිෂ්ඨ ආදේශක - 04

**2017.01.01 සිට 2017.12.31 දක්වා පවත්වන ලද වැඩසටහන් ගණන**

| ආයතනය | පවත්වන ලද වැඩසටහන් ගණන |
|---|---|
| අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන | 24 |
| වෙනත් රාජ්‍ය ආයතන | 28 |
| පෞද්ගලික ආයතන | 27 |
| පවත්වන ලද මුළු වැඩසටහන් ගණන | 79 |

**2017.1.01 සිට 2017.12.31 දක්වා අමාත්‍යාංශයේ උපදෙස් මත නොමිලේ ලබා දුන් සේවාවන්**

| සපයන ලද සේවාව | වැඩසටහන් ගණන |
|---|---|
| ශාලා පහසුකම්, එළිමහන් පරිශ්‍රය හා නේවාසිකාගාරය ලබාදීම | 04 |
| නේවාසිකාගාරය පමණක් ලබාදීම | 04 |
| එකතුව | 08 |

**ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය විසින් මුදල් අයකර ලබාදුන් සේවාවන් (2017.01.01 සිට 2017.12.31 දක්වා)**

| සපයන ලද සේවාව | වැඩසටහන් ගණන | මුළු මුදල රු. | රාජ්‍ය ආදායමට බැර කිරීම රු. | ආයතනික නඩත්තු ගාස්තුව රු. |
|---|---|---|---|---|
| නේවාසික පහසුකම් පමණක් ලබාදීම | 06 | 65,850.00 | 13,910.00 | 51,940.00 |
| ශාලා පහසුකම් පමණක් ලබාදීම | 47 | 82,262.50 | 52,958.75 | 29,303.75 |
| නේවාසික හා ශාලා පහසුකම් ලබාදීම | 18 | 432,122.50 | 203,563.75 | 228,558.75 |
| **මුළු ඉපයීම් වටිනාකම** | **71** | **580,235.00** | **270,432.50** | **309,802.50** |

අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන මඟින් පුහුණු වැඩසටහන් පැවැත්වීමේ දී 65%ක් රාජ්‍ය ආදායමට මුදල් බැර කිරීමක් සිදු කරනු නොලැබේ.

## 6. අභ්‍යන්තර කටයුතු

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ භෞතික හා මානව සම්පත්ද, මූල්‍ය සම්පත්ද, එම දෙපාර්තමේන්තුවල අභිමතාර්ථ වෙනුවෙන් ප්‍රශස්ත ලෙස උපයෝගී කරගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම, සම්බන්ධීකරණය, මඟපෙන්වීම හා පසු විපරම අභ්‍යන්තර කටයුතු අංශය වෙත පැවරී තිබේ.

**කාර්යභාරය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සියලුම ආයතනික කටයුතු (විදේශ නිවාඩු, අතිකාල දීමනා සඳහා අනුමැතිය ලබාදීම, බඳවාගැනීම්, ස්ථානමාරු, උසස් කිරීම්, විනය පරීක්ෂණ විගණන හා කළමනාකරණ කමිටු මෙහෙයවීම, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම) සම්බන්ධීකරණය සිදුකරයි.

කාර්යභාරය - 2017.01.01 සිට 2017.12.31 දක්වා

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

| අනු අංකය | කාර්යය | සංඛ්‍යාව |
|---|---|---|
| i | ශ්‍රී ලංකා පුරවැසිභාවය ප්‍රදානය කිරීමට යොමු කරන ලද නාම ලේඛන සඳහා අනුමැතිය ලබාදීම | |
| | ❍ 5(2)වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම | 9,317 |
| | ❍ 8වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම | 06 |
| | ❍ 11 වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම | 81 |
| | ❍ 12 වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම | 06 |
| ii | ශ්‍රී ලංකා පුරවැසිභාවය අත්හැරීමේ නාම ලේඛන සඳහා 19 වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම | 94 |
| iii | ද්විත්ව පුරවැසි සහතික පත්‍ර ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලබාදීම | 10,648 |
| iv | ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ආයෝජකයන් සඳහා වීසා ලබාදීම | 12,093 |

- ජෛවමිතික ගමන් බලපත්‍රයේ මූලික සැකැස්ම පිළියෙල කර අවසන්ව ඇති අතර අමාත්‍ය මණ්ඩල විසින් නම් කරන ලද සැපයුම්කරු සමඟ ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡා කරමින් පවතී.

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

- 2017 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නව නියෝග මාලාව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පලකර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇත.
- 2016 අංක 08 දරණ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 34(3) වගන්තිය යටතේ වන නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලදී.
- වසර 45 කට පසුව පැවති ජාතික හැඳුනුම්පත වෙනුවට පරිගණක තාක්ෂණය උපයෝගී කරගනිමින් මුද්‍රණය කරනු ලබන නව ස්මාට් ජාතික හැඳුනුම්පතක් නිකුත් කරන ලදී.

## 7. අභ්‍යන්තර විගණන කටයුතු

**පිහිටුවීමේ පරමාර්ථ**

1. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල අභ්‍යන්තර පාලන ක්‍රමයට සම්බන්ධ වී එම කටයුතුවල වැරදි හා වංචා වැලැක්වීම සහ ඒවා අනාවරණය කිරීමට යොදා ඇති අභ්‍යනන්තර සෝදිසි ක්‍රමවල විධිමත් හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ හා ස්වාධීන ඇගයීමක් සිදු කිරීම.
2. එක් එක් ආයතනයන් වෙත පැවරී ඇති සංවර්ධන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී/ ප්‍රගති සමාලෝචන කමිටුව වෙත ප්‍රගති පාලනය සම්බන්ධයෙන් සහාය වීම.
3. උචිත අවස්ථාවන්වලදී මෙම කර්තව්‍යයන්හි නිරතවන අයවලුන්, ආයතන ප්‍රධානීන් සහ ප්‍රගති/ අන්වේෂණ කමිටු අතර සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියා කිරීම.

**කාර්යභාරය**

1. වැරදි හා වංචා වැලැක්වීම සඳහා ආයතනය තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය, සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරීත්වය අතින් සාර්ථකදැයි සොයා බැලීම.
2. ගිණුම්කරණ පිළිවෙත් මගින් නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
3. කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයෙහි ගුණාත්මකභාවය ඇගයීම.
4. අලාභ හානිවලින් ආයතනය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා යොදා ඇති ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මක භාවය පිළිබඳ ඇගයීම.
5. රජයේ ආයතන සංග්‍රහය, රජයේ මූල්‍ය රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලනය භාර අමාත්‍යාංශය හා භාණ්ඩාගාරය විසින් වරින් වර නිකුත් කරනු ලබන පරිපූරක උපදෙස් පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.
6. නාස්තිය, නිෂ්කාර්ය ධාරිතාවය, පමණ ඉක්මවා කෙරෙන වියදම් වැලැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට යොදා ඇති අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.
7. ආයතනයේ දේපළ හා වත්කම් ආරක්ෂා කිරීම හා අරපිරිමැස්මෙන් යුතුව උපයෝජනය කරන්නේ දැයි සොයා බැලීම.
8. අවශ්‍ය අවස්ථාවලදී විශේෂ විමර්ෂණ පැවැත්වීම.

### සාමාන්‍ය විගණන පරීක්ෂාවන්

1. සංස්කෘතික මධ්‍යස්ථාන විගණන පරීක්ෂාවන් සිදු කිරීම.

| | | |
|---|---|---|
| ❍ කඩුවෙල | ❍ හාරිස්පත්තුව | ❍ දැරණියගල |
| ❍ ඇඹිලිපිටිය | ❍ ගලගෙදර | ❍ දෙහිඕවිට |
| ❍ වරකාපොළ | ❍ ශ්‍රී ජපුර වි.වි. | ❍ කටුවන |
| ❍ ගලිගමුව | ❍ කොත්මලේ | ❍ වැලිමඩ |
| ❍ රුවන්වැල්ල | ❍ නුවරඑළිය | ❍ ඌව පරණගම |
| ❍ යටියන්තොට | ❍ ඉමදූව | ❍ හඟුරන්කෙත |
| ❍ තිහගොඩ | ❍ යක්කලමුල්ල | ❍ වලපනේ |
| ❍ මාතර නූපේ | ❍ මාපලගම | ❍ සීතාවක |
| ❍ මඩුල්ල | ❍ ගඟවටකෝරලේ | ❍ වාරියපොල |
| ❍ සියඹලාණ්ඩුව | ❍ දෙල්තොට | ❍ කුරුවිට |
| ❍ පොල්පිතිගම | ❍ මාතලේ | ❍ දික්වැල්ල |
| ❍ මල්ලවපිටිය | ❍ රත්තොට | ❍ දෙවිනුවර |
| ❍ ගල්ගමුව | ❍ උකුවෙල | ❍ පල්ලම |

| | | |
|---|---|---|
| ❍ ගිරිබාව | ❍ අකුරැස්ස | ❍ වේයන්ගොඩ පුහුණු මධ්‍යස්ථානය |
| ❍ උඩුනුවර | ❍ කඹුරුපිටිය | ❍ අත්තනගල්ල |
| ❍ යටිනුවර | ❍ මුලටියන | ❍ අඹන්පොල |
| ❍ ගෝනාපීනුවල | ❍ පූජාපිටිය | ❍ මහව |
| ❍ දොම්පේ | ❍ පාතදුම්බර | ❍ බඩල්කුඹුර |
| ❍ ඇඹරළුව | ❍ හතරලියැද්ද | ❍ කන්දකැටිය |
| ❍ කැස්බෑව | ❍ අලහැර | ❍ මීගහකිවුල |
| ❍ මාස්පොත | ❍ දියතලාව | ❍ සොරණාතොට |
| ❍ අලව්ව | ❍ හල්දුම්මුල්ල | ❍ හාලිඇල |

මෙම මධ්‍යස්ථාන පෙර විගණිත දින සිට මූල්‍ය කටයුතු, පරිපාලන කටයුතු, සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම හා ක්‍රියාකාරී තත්ත්වය, මධ්‍යස්ථානයෙන් පිටත පවත්වාගෙන යනු ලබන ග්‍රාමීය සමාජවල ක්‍රියාකාරීත්වය, වත්මන් ඉදිකිරීම් හා අලුත්වැඩියාවන්, භූමිය පවරා ගැනීම, පවරා ගැනීමට යෝජිත ඉඩම් පිළිබඳ සොයා බැලීම ඇතුළු සියළුම කාර්යයන් පිළිබඳ පරීක්ෂාවන් සිදු කෙරේ.

2. 2016 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමස්ථ ප්‍රගතිය පරීක්ෂාව
3. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින ජන සංගීත සංරක්ෂණ මධ්‍යස්ථානයේ කටයුතු පිළිබඳ යොයා බැලීම
4. විගණන විමසුම් තුලින් හඳුනාගත් පොදු අඩුපාඩු නිවැරදි කිරීම
5. වයඹ ලේකම් කාර්යාලයේ රාජකාරී පිළිබඳ සොයා බැලීම
6. ඉරක්කාමන්, දමන, උහන, මහඔය, පදියතලාව සංස්කෘතික මධ්‍යස්ථානවල නව ඉදිකිරීම් පිළිබඳ ඉදිකිරීම් අංශය හා ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාව
7. කැස්බෑව සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් පරීක්ෂාව
8. කෑගල්ල සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් පිළිබඳ ප්‍රගති සමාලෝචනය
9. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සාහිත්‍යය සම්මාන උළෙල - 2016 මිලදී ගැනීම් සහ ගෙවීම් පරීක්ෂාව
10. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය චිත්‍ර උළෙල - 2016 පිළිබඳ ලිපි ගොනු පරීක්ෂාව
11. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රූපවාහිනී රාජ්‍ය සම්මාන උළෙල - 2016 මිලදී ගැනීම් සහ ගෙවීම් පරීක්ෂාව
12. සංස්කෘතික මධ්‍යස්ථානවලට ලබාදුන් අත්තිකාරම් නොපියවීම පිළිබඳ පරීක්ෂාව
13. මාදම්පේ, මහකුඹුක්කඩවල සංස්කෘතික මධ්‍යස්ථානවල නව ඉදිකිරීම් පරීක්ෂාව
14. වාකරේ, වාකරේ ආදිවාසී, වෙන්කලඩි, දමන නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් පරීක්ෂාව
15. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සරප් කවුන්ටරයේ රාජකාරී පරීක්ෂාව
16. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අනුව තොරතුරු නිකුත් කිරීමේ කාර්යය පිළිබඳ පරීක්ෂාව
17. වයඹ ලේකම් කාර්යාලය මඟින් 94/3211 රථයේ සිදුකල අලුත්වැඩියාව පිළිබඳ පරීක්ෂාව
18. 2017 ජාතික සාහිත්‍ය කලා මහෝත්සවයේ කටයුතු පිළිබඳ පරීක්ෂාව
19. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගබඩාවේ දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ සොයා බැලීම

**විශේෂ විගණන පරීක්ෂාවන්**

1. කැලණිය, දිවුලපිටිය, මාවතගම, බමුණාකොටුව, පොල්ගහවෙල නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් පරීක්ෂාව
2. කොලොන්න, කහවත්ත නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් පිළිබඳ ස්ථානීය පරීක්ෂාව
3. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට අවශ්‍ය ගොඩනැගිලි කුලියට ගැනීමේ දී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව යාමක් පිළිබඳ පෙත්සම් පරීක්ෂාව
4. ගණකාධිකාරී ගෙවීම් (ii) ගේ ව්‍යාජ අත්සන යොදා වව්චර්වල වියදම සහතික කර තිබීම පිළිබඳ පැමිණිලි පරීක්ෂාව
5. මාතර නූපේ සංස්කෘතික මධ්‍යස්ථානයේ හිටපු ස්ථාන භාර සං.ප්‍ර .නි. මුදල් වැය කල ආකාරය පිළිබඳ පෙත්සම් පරීක්ෂාව
6. තිහගොඩ මධ්‍යස්ථානය පිළිබඳ පෙත්සම් පරීක්ෂාව
7. මිල්ලනිය, බණ්ඩාරගම, කරන්දෙනිය සංස්කෘතික මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය පිළිබඳ හදිසි විගණන පරීක්ෂාව
8. ගංවතුරෙන් විනාශයට පත් පිටබැද්දර, මාපලගම, නිවිතිගල යන සංස්කෘතික මධ්‍යස්ථානවල හානි පරීක්ෂාව සහ වර්තමාන තත්ත්වය සොයා බැලීම
9. කොළඹ සහ ගම්පහ, කළුතර, ගාල්ල, කුරුණෑගල, කෑගල්ල යන දිස්ත්‍රික්කවල හඳුනාගත් සංස්කෘතික මධ්‍යස්ථානවල ඩෙංගු ක්ෂේත්‍ර පරීක්ෂාව
10. ඇලහැර සංස්කෘතික මධ්‍යස්ථානයේ පවතින ගැටළු සහගතතාවය පිළිබඳ පෙත්සම් පරීක්ෂාව
11. කටුවන සංස්කෘතික මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීගේ ක්‍රියා කලාපය පිළිබඳ පෙත්සම් පරීක්ෂාව
12. බඩල්කුඹුර සංස්කෘතික මධ්‍යස්ථානයේ සම්පත්දායක දීමනා සකස් කිරීම පිළිබඳ පරීක්ෂාව
13. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල විශ්ව කෝෂ කාර්යාලය සඳහා සහකාර කර්තෘ තනතුරට බඳවා ගැනීමේ පෙත්සම් පරීක්ෂාව